# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1921/66 – 2015 ජූලි මස 03 වැනි සිකුරාදා - 2015.07.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාතේ පළාත් සභාව

බස්නාහිර පළාතේ 2015 අංක 01 දරන බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය

බස්නාහිර පළාතේ, පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මම, බස්නාහිර පළාතේ පළාත් සභාවේ 2015 අංක 01 දරන බඩු උකස්ගන්නන්ගේ ප්‍රඥප්තිය සඳහා බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමාගේ අනුඥව 2015.06.09 දින ලැබී ඇති හෙයින්, එම ප්‍රඥප්තිය 2015.06.09 දින සිට ක්‍රියාත්මක වන බව මෙයින් නිවේදනය කරමි.

ප්‍රසන්න රණතුංග,
බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ
මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන,
පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස් බල හා රැකීරක්ෂා,
ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍ය.

2015 ජූලි මස 03 වැනි දින,
කොළඹ 07,
ශ්‍රාවස්ති මන්දිරය,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

**බස්නාහිර පළාතේ පළාත් සභාවේ 2015 අංක 01 දරන බඩු උකස්ගන්නන්ගේ ප්‍රඥප්තිය**

බැංකුවක් විසින් කරගෙන යනු ලබන බඩු උකස් ගැනීමේ ව්‍යාපාරය හැර බඩු උකස් ගන්නන්ගේ ව්‍යාපාරය විධිමත් කිරීම සඳහා ද, ඊට ආනුශාංගික හෝ වෙනත් කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද, 2001 අංක 03 දරන බඩු උකස්ගන්නන්ගේ ප්‍රඥප්තිය පරිච්ඡින්න කිරීම සඳහා ද, වූ ප්‍රඥප්තියකි. මේ ප්‍රඥප්තියේ විධිවිධාන 1942 අංක 13 දරන බඩු උකස් ගන්නන්ගේ ආඥාපනතේ විධිවිධානවලට අනනුකූල වේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

1A - PG 2538 — 506 (2015/07)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*I වන පරිච්ඡේදය*

*සාමාන්‍ය*

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය

1. මෙම ප්‍රඥප්තිය බස්නාහිර පළාතේ පළාත් සභාවේ 2015 අංක 01 දරන බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමතය ලැබූ දින සිට ක්‍රියාත්මක වන්නේ ය.

*II වන පරිච්ඡේදය*

බඩු උකස් ගන්නන්ගේ ව්‍යාපාරය පවත්වාගෙන යාම තහනම් තැනැත්තෝ

බඩු උකස් ගන්නන්ගේ ව්‍යාපාරය කරගෙන යෑම ඇතැම් තැනැත්තන්ට තහනම් බව

2. කිසියම් තැනැත්තෙකු -

(අ) ශ්‍රී ලංකා පුරවැසියෙකු නොවන පුද්ගලයෙකු වන්නේ නම් ; හෝ

(ආ) විදේශීය සමාගමක් වන්නේ නම් ; හෝ

(ඇ) විදේශීය ව්‍යාපාර ආයතනයක් වන්නේ නම් ; හෝ

(ඈ) මෙම ප්‍රඥප්තියේ 10 වන වගන්තියේ සඳහන් යම් අශක්නුතාවක් හේතුවෙන් වරදකට වරදකරුවෙකු වී ඇත්නම් හෝ නුසුදුස්සෙකු වී ඇත්නම්

නියමිත දිනයේදී හෝ ඉන්පසු, ඒ තැනැත්තා විසින් උකස් ගන්නන්ගේ ව්‍යාපාරය කරගෙන නොයායුතු ය.

*III වන පරිච්ඡේදය*

*ලියාපදිංචි කිරීම*

ව්‍යාපාරය ආරම්භ කිරීමට පෙර ලියාපදිංචි වියයුතු බව

3. (1) මෙම ප්‍රඥප්තිය යටතේ උකස් බලපත්‍ර ලබා ගැනීමට අපේක්ෂා කරන සෑම තැනැත්තෙක් විසින්ම, තම ව්‍යාපාරය ආරම්භ කිරීමට පෙර ලියාපදිංචි වීම සඳහා අයදුම්කර ආදායම් කොමසාරිස්වරයා වෙතින් ඒ සඳහා ලියාපදිංචිය ලබාගත යුතු ය.

ආදායම් කොමසාරිස්වරයා වෙත දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුය

(2) එසේ අයදුම් කිරීමේදී අයදුම් කරන්නා විසින් අයදුම්පත්‍රය සමග අයදුම් කරන අවස්ථාව වන විට ඒ දක්වා තමන් යම් නීති විරෝධී සහ/හෝ යම් අනීතික ක්‍රියාවක් සිදු නොකළ බවට සහ/හෝ එසේ යම් ක්‍රියාවකට වරදකරු වී නොමැති බවට දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළයුතු අතර අයදුම් කරන්නා අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබූ යම් තැනැත්තෙකු හෝ තමාට එරෙහිව යම් නඩුවක් පවතින තැනැත්තෙකු නම් එම නඩුවට අදාළ සියලු තොරතුරු අඩංගු දිවුරුම් ප්‍රකාශයක් ආදායම් කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

*IV වන පරිච්ඡේදය*

*බලපත්‍ර ලබාගැනීම*

බඩු උකස් ගන්නන් විසින් බලපත්‍රයක් ලබාගත යුතු බව

4. (1) බඩු උකස් ගන්නන්ගේ ව්‍යාපාරය කරගෙන යනු ලබන සෑම ව්‍යාපාරික මධ්‍යස්ථානයක් සහ/හෝ ශාඛාවක් වෙනුවෙන්ම, ඒ එක් එක් ව්‍යාපාරික මධ්‍යස්ථානය සහ/හෝ ශාඛාව සඳහා ආදායම් කොමසාරිස්වරයා විසින් වෙන් වෙන් වශයෙන් නිකුත් කරන ලද බලපත්‍රයක් දරන්නේ නම් මිස, කිසිදු තැනැත්තෙකු විසින් බඩු උකස් ගන්නන්ගේ ව්‍යාපාරය ස්ථානයක් පවත්වාගෙන නොයායුතු ය.

(2) ඉහත (1) වන උප වගන්තිය යටතේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක්ම මෙහි පළමුවන උපලේඛනයේ දැක්වෙන 'අ' ආකෘතියට සාරානුකූල විය යුතු ය.

(3) ඉහත (1) වන උප වගන්තිය යටතේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක්ම එහි සඳහන් ව්‍යාපාර ස්ථානයට සහ ලිත් වර්ෂයක කාලයක් සඳහා පමණක් වලංගු වන්නේ ය.

බලපත්‍රයේ පිටපතක් පොලිස් ස්ථානාධිපති වෙත යැවිය යුතු බව

5. ඉහත 4 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයකම එක් පිටපතක්, එම බලපත්‍රයට අදාල බඩු උකස් ගන්නන්ගේ ව්‍යාපාරය පවත්වාගෙන යන්නේ යම් ප්‍රදේශයක් තුළද, එම ප්‍රදේශය භාරව සිටින පොලිස් ස්ථානාධිපතිවරයා වෙත ආදායම් කොමසාරිස්වරයා විසින් යැවිය යුතු ය.

ආදායම් කොමසාරිස් වරයාගේ පූර්ව අනුමැතිය නොමැතිව බලපත්‍රය පවරාදීම බල රහිත බව

6. ඉහත 4 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් යම් උකස් ව්‍යාපාරයකට අදාල වේද, එකී බලපත්‍රය ආදායම් කොමසාරිස්වරයාගේ ලිඛිත අනුමැතියක් ලබා නොගෙන වෙනත් අයෙකුට පවරා දීම ශුන්‍ය හා බල රහිත වන්නේ ය.

බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කිරීම

7. (1) බඩු උකස් ගන්නන්ගේ ව්‍යාපාර ස්ථානයක් කරගෙන යාම සඳහා බලපත්‍රයක් ලබා ගැනීමට අපේක්ෂා කරන සෑම තැනැත්තකු විසින් ම :-

(අ) බලපත්‍රය අයදුම් කරන අවස්ථාව වන විට ඒ දක්වා තමන් යම් නීති විරෝධී සහ/හෝ යම් අනීතික ක්‍රියාවක් සිදු නොකළ බවට සහ/හෝ එසේ යම් ක්‍රියාවකට වරදකරු වී නොමැති බවට දිවුරුම් ප්‍රකාශයක් හෝ අයදුම් කරන්නා අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබූ යම් තැනැත්තෙකු හෝ තමාට එරෙහිව යම් නඩුවක් පවතින තැනැත්තෙකු නම් එම නඩුවට අදාළ සියළු තොරතුරු අඩංගු දිවුරුම් ප්‍රකාශයක් සහ ;

(ආ) ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ සහතිකය හෝ එය සමාගමක් නම් සමාගම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ ලියා පදිංචි කිරීමේ සහතිකය සහ සාංගමික ව්‍යවස්ථාවලියක් වේ නම් එහි පිටපතක්.

(ඇ) මෙම ප්‍රඥප්තියේ 8 වන වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු වාර්ෂික ගිණුම් වාර්තා ද සමග බඩු උකස් ගැනීමේ ව්‍යාපාරික මධ්‍යස්ථාන එකකට වැඩි සංඛ්‍යාවක් හෝ එහි ශාඛා මධ්‍යස්ථාන එකකට වැඩි සංඛ්‍යාවක් පවත්වාගෙන යනු ලබන්නේ නම්, එකී එක් එක් මධ්‍යස්ථානය සඳහා හෝ එකී ශාඛා මධ්‍යස්ථාන සඳහා වෙන් වෙන්ව,

(ඈ) මෙම ප්‍රඥප්තියේ 27 වන වගන්තිය ප්‍රකාරව ගන්නා ලද රක්ෂණ සහතිකයේ සහතික කළ පිටපතක්

(ඉ) මෙම ප්‍රඥප්තියේ 43 වන වගන්තියේ (1) වන උප වගන්තියේ විධිවිධාන පරිදි සකස් කරන ලද සාධන පත්‍රයක්.

ආදායම් කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන ආකෘතිපත්‍රයට සාරානුකූලව ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කළ යුතු ය.

(2) බලපත්‍රලාභියෙකු විසින් කරගෙන යනු ලබන බඩු උකස් ගන්නන්ගේ ව්‍යාපාරයක් වෙනුවෙන් අනුගාමී ලිත් වර්ෂයක් සඳහා බලපත්‍රයක් ලබා ගැනීමේදී, අදාළ ඉල්ලුම්පත්‍රය, පවත්නා බලපත්‍රය අවලංගු වීමට නියමිත දිනයට මාස දෙකකට ප්‍රථම ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) බඩු උකස් ගන්නන්ගේ ව්‍යාපාරයක් කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම්පත්‍රය ලියාපදිංචි කිරීමේදී බලපත්‍ර නිකුත් කිරීම සඳහා අයකළ යුතු යයි 53 වන වගන්තියේ විධිවිධාන පරිදි අමාත්‍යවරයා විසින් නියම කර ඇති මුදල අදාළ ලියාපදිංචි ගාස්තුව ලෙස ගෙවිය යුත්තේ ය. ඊට අතිරේකව 9(2) උප වගන්තිය යටතේ නියම කර ඇති මුදලක් 9(3) උප වගන්තියේ විධිවිධාන වලට යටත්ව තැන්පත් කළ යුතු ය.

(4) වාර්ෂික බලපත්‍රය නියමිත දිනට අළුත් නොකර බඩු උකස් ගන්නන්ගේ ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලැබූ බඩු උකස් ගන්නකු වෙත වාර්ෂික බලපත්‍රය නිකුත් කරන්නේ නම්, බලපත්‍රයක් නොමැතිව බඩු උකස් ගන්නෙකුගේ ව්‍යාපාරය කරගෙන ගිය සෑම වර්ෂයක් සඳහාම අදාළ බලපත්‍ර ගාස්තුවද, බලපත්‍රයක් නොමැතිව ව්‍යාපාරය පවත්වාගෙන ගිය සෑම මාසයක් සඳහාම අදාළ බලපත්‍ර ගාස්තුවෙන් 10% ක් බැගින් වූ ප්‍රමාද ගාස්තුවක් ද අයකළ යුතු ය.

(5) වාර්ෂික බලපත්‍රයක් ලබා නොගෙන බඩු උකස් ගැනීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලැබූ බඩු උකස් ගන්නකු වෙත වාර්ෂික බලපත්‍රය නිකුත් කරන්නේ නම්, ලියාපදිංචි ගාස්තුව සහ බලපත්‍රයක් නොමැතිව බඩු උකස් ගන්නෙකුගේ ව්‍යාපාරය කරගෙන ගිය සෑම වර්ෂයක් සඳහාම අදාළ බලපත්‍ර ගාස්තුවද, බලපත්‍රයක් නොමැතිව ව්‍යාපාරය පවත්වාගෙන ගිය සෑම මාසයක් සඳහාම අදාළ බලපත්‍ර ගාස්තුවෙන් 20% ක් බැගින් වූ ප්‍රමාද ගාස්තුවක් ද අයකළ යුතු ය.

(6) ඉල්ලුම්කරු බලපත්‍රයක් ලබා ගැනීම සඳහා මෙම ප්‍රඥප්තියේ හා ඒ යටතේ පනවා ඇති රෙගුලාසිවල සඳහන් අවශ්‍යතා සම්පූර්ණ කර තිබේනම් හා නුසුදුසුකම් නොමැතිනම් ආදායම් කොමසාරිස්වරයා විසින් බලපත්‍රය නිකුත් කිරීම ප්‍රතික්ෂේප නොකළ යුතු ය.

(7) යම් තැනැත්තෙකු විසින් බඩු උකස් ගන්නන්ගේ ව්‍යාපාරය කරගෙන යාමට බලපත්‍රයක් ලබා ගැනීම සඳහා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරනු ලැබූ විට, බලපත්‍රයක් නිකුත් නොකරන්නේනම්, එසේ නිකුත් නොකිරීම පිළිබඳව තම තීරණය හේතු සහිතව එම ඉල්ලීම ලැබී දින තිහක් ඉකුත් වීමට ප්‍රථම ආදායම් කොමසාරිස්වරයා විසින් ඉල්ලුම්කරු වෙත දන්වා යැවිය යුතු ය.

බලපත්‍රයක් ලබා ගැනීමේදී වාර්ෂික ගිණුම් ඉදිරිපත්කළ යුතු බව

8. යම් ලිත් වර්ෂයක් සඳහා බලපත්‍රයක් ඉල්ලා සිටින බඩු උකස් ගන්නකු ස්වකීය බඩු උකස් ගැනීමේ ව්‍යාපාරයට අදාළ ඊට පෙර මුදල් වර්ෂයේ වාර්ෂික ගිණුම් ආදායම් කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

ඇතැම් තැනැත්තන්ට බලපත්‍ර නිකුත් කිරීම තහනම් කිරීම

9. (1) මෙම ප්‍රඥප්තියේ 2 වන වගන්තියේ විධිවිධාන ක්‍රියාත්මක වීම හේතුකොට ගෙන බඩු උකස්ගන්නකුගේ ව්‍යාපාරය කරගෙන යෑම තහනම් වන යම් තැනැත්තෙකුට, බඩු උකස් ගන්නකුගේ ව්‍යාපාරය කරගෙන යාම සඳහා වූ බලපත්‍රයක් නියමිත දිනයේ දී හෝ ඉන්පසු නිකුත් නොකළ යුතු අතර, ප්‍රමාද දෝෂයක් නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ යම් තැනැත්තෙකු වෙත නිකුත් කරන ලද එවැනි බලපත්‍රයක්, ඒ අනුව ශූන්‍ය හා බල රහිත ලෙස සියළු කාර්යයන් සඳහා සලකනු ලැබිය යුතු ය.

බලපත්‍ර ගාස්තු සහ ඇප මුදල් නියම කිරීම

(2) නිකුත් කරනු ලබන බලපත්‍රයක් සඳහා අයකළ යුතු වාර්ෂික බලපත්‍ර ගාස්තුව සහ බලපත්‍රලාභියකු විසින් තැන්පත් කළ යුතු ඇප මුදල සම්බන්ධව 53 වන වගන්තියේ විධිවිධාන පරිදි අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ කලින් කළ පළ කරනු ලබන නියමයක් මගින් නිශ්චය කරනු ලැබිය යුතු ය.

(3) ආදායම් කොමසාරිස්වරයා විසින් ඇප මුදල් තැන්පත් කරන ලෙසට බලපත්‍රලාභියා වෙත දන්වනු ලබන ඇප මුදල හෝ ඇප මුදල් ඉහත (2) වන උප වගන්තිය යටතේ නියමකර ඇති ආකාරයට, නියම කරනු ලබන රාජ්‍ය බැංකුවක බලපත්‍රලාභියා විසින් පළාත් සභාවේ තැන්පත් ගිණුමකට බැර කරනු ලැබිය යුතුය. ව්‍යාපාරය වසා දැමීමේදී හෝ පැවරීමේදී හැර තැන්පත් මුදල සහ/හෝ ඊට අදාළ පොළී මුදල තැන්පත්කරුට ආපසු ගෙවනු නොලැබිය යුතු ය. එසේ වුවද, බලපත්‍රලාභියා විසින් භාණ්ඩ උකස්කරුවකු හෝ උකස්කරුවන් වෙත කිසියම් මුදලක් ගෙවිය යුතු වේනම් එම මුදල, තැන්පත් මුදලින් හා පොළී මුදලින් අඩුකර ගෙවනු ලැබිය යුතු ය.

බලපත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම

10. බඩු උකස් ගන්නකුගේ ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා බලපත්‍රයක් ඉල්ලුම් කරන යම් තැනැත්තෙකු ;

*(අ)* බඩු උකස්ගන්නකුගේ ව්‍යාපාරය කරගෙන යෑම සඳහා බලපත්‍රයක් නිකුත් කරන ලෙස ඉල්ලීමක් කරන දිනයට පෙරාතුවම වූ අවුරුදු පහ තුළ කවර හෝ අවස්ථාවක දී දණ්ඩ නීති සංග්‍රහයේ XI, XIII, XVII හෝ XVIII වන පරිච්ඡේද යටතේ හෝ කිරුම් මිණුම් පනතේ හෝ මෙම ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ දඬුවම් පැමිණ විය හැකි යම් වරදකට වරදකරු කරනු ලැබ ඇත්නම් ; සහ/හෝ

*(ආ)* මෙම ප්‍රඥප්තියේ 7(1) වන උප වගන්තියේ විධිවිධාන පරිදි ඉදිරිපත් කළ යුතු ලේඛන ඉදිරිපත් කර නොමැත්තේ නම් ; සහ/හෝ

*(ඇ)* මෙම ප්‍රඥප්තියේ 8 වන වගන්තිය යටතේ එකී තැනැත්තා වාර්ෂික ගිණුම් ප්‍රකාශ ඉදිරිපත් කර නොමැත්තේ නම් ; සහ/හෝ

*(ඈ)* මෙම ප්‍රඥප්තිය යටතේ හෝ උකස් බඩු ආඥාපනත යටතේ එකී තැනැත්තා වෙත නිකුත් කරන ලද බලපත්‍රයක් මෙම ප්‍රඥප්තියේ 11 වන වගන්තිය යටතේ අවලංගු කර තිබේ නම් ; සහ/හෝ

*(ඉ)* මෙම ප්‍රඥප්තියේ 12 වන වගන්තියේ (2) වන උප වගන්තියේ ප්‍රකාර *ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ* නම පළකරනු ලැබූ තැනැත්තකු වන්නේ නම් ; සහ/හෝ

*(ඊ)* එකී තැනැත්තා වෙන්දේසිකරුවෙකු වන්නේ නම්,

එවැනි තැනැත්තකුට ආදායම් කොමසාරිස්වරයා විසින් බඩු උකස්ගන්නකුගේ ව්‍යාපාර කරගෙන යෑම සඳහා වූ බලපත්‍රයක් නිකුත් කරනු නොලැබිය යුතු ය.

බලපත්‍රයක් අවලංගු කිරීම

11. (1) මෙම ප්‍රඥප්තියේ 4 වන වගන්තියේ විධිවිධාන යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් දරන යම් තැනැත්තෙකු එම බලපත්‍රය වලංගු කාලය තුළ බඩු උකස්ගන්නකු වශයෙන් ස්වකීය ව්‍යාපාරය හා සම්බන්ධව මෙම ප්‍රඥප්තිය හෝ මෙම ප්‍රඥප්තිය යටතේ පනවා ඇති රෙගුලාසිවලට හෝ පටහැනිව ක්‍රියාකර ඇති බවට පරීක්ෂණයකින් පසුව ආදායම් කොමසාරිස්වරයා සෑහීමට පත් වන්නේ නම් එම බලපත්‍රය අවලංගු කළ හැකිය.

එසේ වුව ද, බලපත්‍රය අවලංගු කිරීමට ප්‍රථම බලපත්‍රලාභියාට ඒ බව දන්වනු ලැබිය යුතු අතර, එයට එරෙහිව කරුණු දැක්වීමට දින තිහක කාලයක් ලබාදිය යුතු ය.

(2) බඩු උකස්ගන්නකු, සහ/හෝ ඔහුගේ යම් සේවකයකු සහ/හෝ නියෝජිතයකු සහ/හෝ මෙම ප්‍රඥප්තිය යටතේ යම් වරදක් සම්බන්ධයෙන් සහ/හෝ, ඔහුගේ ව්‍යාපාරයේදී කරන ලද යම් වංචාවක් සම්බන්ධයෙන් සහ/හෝ සොර බඩු බව දන දනම සොර බඩු භාරගැනීම සම්බන්ධයෙන් සහ/හෝ අධිකරණය විසින් වරදකරු කරනු ලැබූ විට, ආදායම් කොමසාරිස්වරයා විසින් එම බඩු උකස් ගන්නාගේ බලපත්‍රය අවලංගු කළ යුතු ය.

ප්‍රඥප්තියේ නියම සහ කොන්දේසි කඩ කරන බලපත්‍රධාරීන්ගේ නම සහ ලිපිනය ගැසට් පත්‍රයේ සහ පුවත්පත් වල ප්‍රසිද්ධ කළ යුතු බව

12. (1) යම් බලපත්‍රලාභියෙකුගේ බලපත්‍රය වලංගු කාලය ඉක්ම ගොස් තිබේනම් සහ අනුගාමී වර්ෂයට බලපත්‍රයක් නිකුත් නොකරන ලද්දේ නම් එම සෑම බඩු උකස් ගන්නකුගේම නම, ව්‍යාපාර නාමය සහ එම ව්‍යාපාරය කරගෙන යනු ලබන ව්‍යාපාර ස්ථානයේ ලිපිනය ;

(2) මෙම ප්‍රඥප්තියේ 37 වන වගන්තිය යටතේ වරදකට වරදකරු කරනු ලබන සෑම අවස්ථාවකදීම එම තැනැත්තාගේ නම, පෞද්ගලික ලිපිනය, ව්‍යාපාර නාමය, ව්‍යාපාරය පවත්වාගෙන ගිය ස්ථානයේ ලිපිනය;

ආදායම් කොමසාරිස්වරයා විසින් ගැසට් පත්‍රයේ සහ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පුවත්පත්වල දැන්වීමක් මගින් ප්‍රසිද්ධ කළ යුතු ය.

## V වන පරිච්ඡේදය

### බලපත්‍රධාරීන් විසින් පිළිපැදිය යුතු කොන්දේසි

*බඩු උකස් ගන්නකු ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීමට අදහස් කරන විට ඒ බව දැන්වීම*

13. තුන් මසකට වැඩි කාලයක් ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීමට අදහස් කරන සෑම බඩු උකස්ගන්නකු විසින්ම, එසේ බැහැරව යාම පිළිබඳව පළාත් ආදායම් කොමසාරිස්වරයා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය. තවද, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටින කාලය තුළ බඩු උකස්ගන්නන්ගේ ව්‍යාපාරයේ තමාගේ වැඩ කටයුතු කරගෙන යෑම සඳහා සහ තමා වෙනුවෙන් ක්‍රියා කිරීම සඳහා බඩු උකස්ගන්නකුගේ ව්‍යාපාරය කරගෙන යෑමට මෙම ප්‍රඥප්තිය යටතේ බලපත්‍රයක් ලබා ගැනීමට හිමිකම් ඇති තැනැත්තකු නම්කර, ඒ පිළිබඳව ආදායම් කොමසාරිස්වරයාගේ ලිඛිත අනුමැතිය ලබාගත යුතු ය.

*බඩු උකස් ගන්නකු වෙන්දේසිකරුවෙකු වශයෙන් ක්‍රියා නොකළ යුතු බව*

14. බඩු උකස් ගන්නකුගේ ව්‍යාපාරය කරගෙන යනු ලබන තැනැත්තකු විසින් වෙන්දේසිකරුවෙකු වශයෙන් ක්‍රියා කිරීම හෝ වෙන්දේසිකරුවෙකුගේ ව්‍යාපාරය කරගෙන යෑම නොකළ යුතු ය.

*බඩු උකස් ගන්නකු විසින් ව්‍යාපාරයේ නම, බලපත්‍ර අංකය, සහ දෙවන උපලේඛනයේ සඳහන් විස්තර ප්‍රදර්ශනය කිරීම*

15. සෑම බඩු උකස්ගන්නකු විසින්ම-

(1) තමාගේ ව්‍යාපාර ස්ථානයේ පිටත දොරටුවට ඉහළින් පැහැදිලි අකුරෙන් තම ව්‍යාපාරයේ නම, බඩු උකස් ගන්නකු ලෙස ලියාපදිංචි බලපත්‍ර අංකය සහ ''බඩු උකස්ගන්නා'' යන වචන සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂාත්‍රයෙන් ලියා, ප්‍රදර්ශනය කර තැබිය යුතු ය.

(2) තවද; තම ව්‍යාපාර ස්ථානයට පැමිණෙන සෑම පුද්ගලයෙකුටම පෙනෙන පරිදි හා ඒ සෑම පුද්ගලයෙකුටම කියවිය හැකි වන පරිදි, මෙහි දෙවන උපලේඛනයේ දක්වා ඇති විස්තර අඩංගු දැන්වීමක්, සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාත්‍රයෙන්ම ඒ ව්‍යාපාර ස්ථානයේ ප්‍රකටව පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කර තැබිය යුතු ය.

*විස්තර ඇතුළත් කිරීම සඳහා භාවිතා කළ යුතු භාෂාව*

16. බඩු උකස් ගන්නන්ගේ ව්‍යාපාරය කරගෙන යනු ලබන සෑම තැනැත්තකු විසින්ම යම් පොතක, ආකෘති පත්‍රයක හෝ ලේඛණයක යම් විස්තර ඇතුළත් කිරීමට මෙම ප්‍රඥප්තියෙන් නියම කර ඇති අවස්ථාවක, එම විස්තර සිංහලෙන් හෝ දෙමළෙන් ඇතුළත් කළ යුතු ය. එයට අමතරව ඉංග්‍රීසියෙන් ද ඇතුළත් කළ යුතු ය.

*බඩු උකස් ගන්නන් විසින් පවත්වාගෙන යා යුතු පොත්*

17. මෙහි පළමුවන උපලේඛනයෙහි දක්වා ඇති ''ආ'' ආකෘතිය අනුව ඔඩපන පොතක් හා ''ඇ'' ආකෘතිය අනුව ඔඩපන විකුණුම් පොතක්, සෑම බඩු උකස් ගන්නකු විසින්ම පවත්වාගෙන යා යුතු ය.

*උකස් තුණ්ඩු සහ උකස් ගැනීමක් සිදුවීම*

18. (1) සෑම උකස් තුණ්ඩුවක්ම මෙහි පළමුවන උපලේඛනයේ ''ඇ'' ආකෘතියෙහි දක්වා ඇති පරිදි මුල් පත්‍රිකාවකින් හා උප පත්‍රිකා දෙකකින් යුක්තවද එම ආකෘතියෙහි ඇතුළත් නියමයන්ට අනුකූලව ද ලියා අත්සන් කරනු ලැබිය යුතු ය.

(2) දෙවන උපලේඛනයේ සඳහන් විස්තර සෑම උකස් තුණ්ඩුවකම මුල් පිටපතේ පසු පිටෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන්, කියවිය හැකි සේ මුද්‍රණය කර තිබිය යුතු ය.

(3) භාණ්ඩයක් උකස් කරනු ලබන අවස්ථාවක අදාළ උකස් තුණ්ඩුවේ සඳහන් මුදලේ වටිනාකමට නියමිත මුද්දර ඇලවිය යුතු ය. එම මුද්දර සැපයීම සඳහා යන වියදම බඩු උකස්ගන්නා විසින් දැරිය යුතු ය.

(4) (අ) බඩු උකස්කරන්නා විසින්, උකස් තුණ්ඩුව අත්සන් කළහොත් මිස සහ ;

(ආ) බඩු උකස්ගන්නා විසින් උකස් තුණ්ඩුව අත්සන් කොට, එය බඩු උකස්කරන්නාට දුනහොත් මිස සහ ;

කිසිම භාණ්ඩයකට අදාළව උකස් ගැනීමක් සිදුවූවා ලෙස නොසැළකිය යුතු ය.

*පොළී ප්‍රමාණය*

19. කිසිම බඩු උකස්ගන්නකු විසින්, ඔඩපනයක් මත දෙනු ලබන ණයක් වෙනුවෙන්, දෙවන උපලේඛනයේ නිශ්චිතව සඳහන් අනුප්‍රමාණය ඉක්මවන පොළියක් අය නොකළ යුතු ය.

එසේ වුවද, ඔඩපනයක් මත දෙනු ලබන ණයක් වෙනුවෙන් යම් බද්දක් ගෙවිය යුතු වන අවස්ථාවක, බඩු උකස්ගන්නා විසින් එම බද්ද බඩු උකස්කරන්නාගෙන් අයකර ගැනීම, මෙම වගන්තියේ පෙරාතුව වූ විධිවිධානවල ඇතුලත් කිසිවකින් තහනම් කෙරෙන ලෙස නොසැළකිය යුතු ය. මෙම වගන්තියේ ''ඔඩපනය'' යන්නට, උකස් කරන ලද්දා වූද, නියමිත දිනයට පෙර නිදහස් නොකරන ලද්දා වූද ඔඩපනයක් ඇතුළත් වේ.

## *VI* වන පරිච්ඡේදය

### ඔඩපන

*මාස විසිහතරක් තුළ ඔඩපන නිදහස් කළ යුතු බව*

20. සෑම ඔඩපනයක්ම, එය උකස් කරන ලද දින සිට එළඹෙන මාස විසි හතරක, (මෙම ප්‍රඥප්තියේ මින් මතු ''නිදහස් කර ගැනීමේ කාලය'' යනුවෙන් සඳහන් කරනු ලබන) කාලය තුළ දී නිදහස් කරගනු ලැබිය යුතු වන්නේ ය. උකස් කළ දිනය අත්හැර මෙම කාලය ගණන් බලනු ලැබිය යුතු ය.

21. මෙම ප්‍රඥප්තියේ 20 වන වගන්තියේ කුමක් සඳහන්ව වුවද, සෑම ඔඩපනයක් ම, එය නිදහස් කළ යුතු කාල සීමාව ඉකුත්ව ගොස් තිබුණේ වුවද, මෙම ප්‍රඥප්තියේ 29 වන වගන්තියේ විධිවිධාන සළස්වා ඇති ආකාරයට එය බැහැර කරනු ලබන තෙක්, සෑම උකස් කරුවකුටම ඔඩපනය නිදහස් කර ගනු ලැබිය හැකි වන්නේ ය.

*ඔඩපනයක් නිදහස් කර ගැනීමේ ක්‍රියා මාර්ගය*

22. (1) යම් ඔඩපනයකට අදාළ උකස් තුණ්ඩුවේ මුල් පත්‍රිකාව බඩු උකස්කරන්නා විසින් බඩු උකස් ගන්නාට බාර දී, බඩු උකස් ගන්නා හෝ ඔහුගේ නියෝජිතයා හෝ සේවකයා හෝ ඉදිරියේදී එම මුල් පත්‍රිකාව අත්සන් කොට, තම අනන්‍යතාව ඔප්පු කළහොත් එම ඔඩපනය නිදහස් කර ගැනීමේ හිමිකම් එම උකස්කරුට ඇත්තේ ය.

(2) බඩු උකස් කළ තැනැත්තා නොවන යම් පුද්ගලයෙකු විසින් යම් ඔඩපනයකට අදාළ උකස් තුණ්ඩුවේ මුල් පත්‍රිකාව ඒ ඔඩපනය, උකස්කළ තැනැත්තාගේ අත්සනින් යථා පරිදි පිටසන් කරවාගෙන උකස් ගන්නා වෙත ඉදිරිපත් කළහොත් සහ ඒ තැනැත්තා විසින් බඩු උකස් ගන්නා හෝ ඔහුගේ නියෝජිතයා හෝ සේවකයා හෝ ඉදිරියේදී එම මුල් පත්‍රිකාව අත්සන් කළහොත් සහ තම අනන්‍යතාවය ඔප්පුකර සිටියහොත්, එම ඔඩපනය නිදහස් කර ගැනීමේ හිමකම් ඒ තැනැත්තාට ඇත්තේ ය.

(3) බඩු උකස්කරන්නාගේ මරණය නිසා හෝ නෛතික අශක්නුතාව නිසා හෝ එම ඔඩපනය නිදහස් කර ගැනීමේ හිමිකම තමාට අතැයි ඔඩපනයට අදාළ උකස් තුණ්ඩුවේ මුල් පත්‍රිකාව දරන තැනැත්තා විසින් කියා සිටින්නා වූද, එහෙත් බඩු උකස් කරන්නාගේ අත්සනින් යථා පරිදි පිටසන් කරවාගෙන උකස් තුණ්ඩුවේ මුල් පත්‍රිකාව බඩු උකස්ගන්නා වෙත ඉදිරිපත් කිරීමට නොහැකි වන්නා වූද, අවස්ථාවක, එකී දරන්නා විසින් සහ ඔහුගේ අනන්‍යතාවයට සාක්ෂි දරන්නා විසින් සමාදාන විනිශ්චයකාරවරයෙකු හෝ දිවුරුම් කොමසාරිස්වරයෙකු ඉදිරියේදී යථා පරිදි කරන ලද දිවුරුම් ප්‍රකාශ ද සමග එකී ඔඩපනයට අදාළ උකස් තුණ්ඩුවේ මුල් පත්‍රිකාව එකී දරන්නා විසින් බඩු උකස්ගන්නා වෙත ඉදිරිපත් කළහොත් සහ ඒ තැනැත්තා විසින් බඩු උකස් ගන්නා හෝ ඔහුගේ නියෝජිතයා හෝ සේවකයා හෝ ඉදිරියේ දී එම මුල් පත්‍රිකාව අත්සන් කළහොත් සහ තම අනන්‍යතාවය ඔප්පුකර සිටියහොත් එම ඔඩපනය නිදහස් කර ගැනීමට එකී මුල් පත්‍රිකාව දරන තැනැත්තාට හිමිකම ඇත්තේ ය.

(4) ඉහත (1), (2) සහ (3) වන උප වගන්තිවල විධිවිධානවලට යටත්ව, ඔඩපනය මත ගෙවිය යුතු ණය සහ ඊට අයවිය යුතු පොළිය ද, ඒ ණය වෙනුවෙන් ගෙවිය යුතු යම් බද්දක් වේනම් එම බද්ද ද ගෙවූ විට බඩු උකස් ගන්නා විසින්, අවස්ථාවෝචිත පරිදි, එකී ඔඩපනය හා සම්බන්ධ උකස් තුණ්ඩුව ඉදිරිපත් කරන බඩු උකස්කරන්නා වෙත හෝ උකස් තුණ්ඩුව දරන්නා වෙත එම ඔඩපනය භාරදිය යුතු ය. ඉහත සඳහන් ආකාරයට බඩු උකස් ගන්නා විසින් කටයුතු කර ඇති විටකදී එකී ගණුදෙනුව මත ඔහුට කිසිදු වගකීමක් උද්ගත නොවිය යුතු ය.

*නීති විරෝධී ලෙස උකස් තුණ්ඩු තමා භාරයේ තබා ගැනීම*

එසේ වුවද උකස් තුණ්ඩුව දරන්නා, එය සොරකම් කර හෝ අන්‍යාකාරයකින් නීති විරෝධීව එහි සන්තකය ලබා ගෙන හෝ ඇති බවට සැක කිරීමට බඩු උකස්ගන්නකුට හේතු ඇත්නම්, ඒ පිළිබඳව ප්‍රදේශය අයත් පොලිස් ස්ථානය වෙත වහාම දැනුම්දිය යුතු ය.

*උකස් තුණ්ඩු නොමැති බඩු අයිතිකරුවන්ට සහ උකස් කරන්නන්ට ආරක්ෂාව සැපයීම*

23. (1) තමා යම් ඔඩපනයක අයිතිකරු බව කියා සිටින, එහෙත් උකස් තුණ්ඩුවේ මුල් පත්‍රිකාව නොදරන යම් තැනැත්තෙකු හෝ 22(3) උප වගන්තිය අනුව උකස් තුණ්ඩුවේ මුල් පත්‍රිකාව දැරීමට තමාට හිමිකම් තිබේ යැයිද එනමුත් එම තුණ්ඩුවේ මුල් පත්‍රිකාව නැති වී, සොරකම්කර, අස්ථානගත වී, විනාශ වී හෝ කිසිවෙකු වංචනික ලෙස තමාගෙන් ලබාගෙන හෝ ඇතැයි ද කියා සිටින යම් තැනැත්තෙකු විසින් සමාදාන විනිශ්චයකරුවෙකු හෝ දිවුරුම් කොමසාරිස්වරයෙකු ඉදිරියේදී තමාද, තමාගේ අනන්‍යතාවයට සාක්ෂි දරන වෙනත් තැනැත්තෙකුද විසින් යථා පරිදි කරනු ලැබූ දිවුරුම් ප්‍රකාශ බඩු උකස් ගන්නා වෙත භාරදෙනු ලැබූ විටකදී එකී භාණ්ඩ නිදහස් කිරීමේ හිමිකම තිබිය යුතු ය. ඒ උකස් තුන්ඩුවේ මුල් පත්‍රිකාව ඒ තැනැත්තා විසින් ඉදිරිපත් කරනු ලැබූ කල්හි හිමිවන සියළු අයිතිවාසිකම් හා ප්‍රතිකර්ම ඔහු හා බඩු උකස් ගන්නාද අතර ඇති වන්නේ ය. එවිට ඔඩපනයක් බේරා ගැනීමේ කාර්යය සඳහා ඔහු විසින් අත්සන් කළයුතු වන්නේ 18 වන වගන්තියෙන් නියමිත උකස් තුණ්ඩුවේ මුල් පත්‍රිකාව නොව උප පත්‍රිකාවය.

(2) ඉහත (1) වන උප වගන්තිය යටතේ යම් තැනැත්තෙකු විසින් කරනු ලබන ප්‍රකාශයෙහි අඩංගු යම් වැදගත් තොරතුරක් සම්බන්ධයෙන් වංචනික හෝ ව්‍යාජ හෝ බවට, තත්‍ය හෝ අනුමිත හෝ දැන්වීමක් බඩු උකස්

ගන්නාට ලැබී නැත්නම්, ඔඩපනය භාරදීම හෝ එම ප්‍රකාශය අනුව වෙනත් ආකාරයකින් ක්‍රියාකිරීම සම්බන්ධයෙන් වන වගකීමෙන් බඩු උකස් ගන්නා මෙයින් ආරක්ෂා කරනු ලැබේ.

24. (1) ඔඩපනයක් නිදහස් කර ගැනීමේ කාර්යය සඳහා උකස් තුණ්ඩුවක මුල් පත්‍රිකාව බඩු උකස් ගන්නා වෙත භාර දෙනු ලැබූ අවස්ථාවක එම ඔඩපනය නිදහස් කර ගත් දින සිට ගණන් ගනු ලබන මාස දොළහක කාලයක් ඉකුත් වන තෙක් බඩු උකස් ගන්නා විසින් එම උකස් තුණ්ඩුවේ මුල් පත්‍රිකාව හා දෙවන හා තෙවන පත්‍රිකා තමන් සන්තකයේ තබාගත යුතු ය.

*ඔඩපනය නිදහස් කර ගැනීමෙන් හෝ විකිණීමෙන් හෝ පසු උකස් තුණ්ඩු බඩු උකස්ගන්නා විසින් තබාගත යුතු බව*

(2) ඔඩපනයට අදාළ උකස් තුණ්ඩුවේ මුල් පත්‍රිකාව භාර නොදී, එම ඔඩපනය නිදහස් කරගනු ලැබූ අවස්ථාවක, එසේ එම ඔඩපනය නිදහස් කරගත් දින සිට ගණන් ගනු ලබන මාස දොළහක කාලයක් ඉකුත් වන තෙක් එම ඔඩපනයට අදාළ උකස් තුණ්ඩුවේ දෙවන හා තෙවන පිටපත් සහ එම නිදහස් කර ගැනීමේ කාර්යය සඳහා 23 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ තමා වෙත භාර දෙන ලද දිවුරුම් ප්‍රකාශය බඩු උකස්ගන්නා විසින් තම සන්තකයේ තබාගත යුතු ය.

(3) මෙම ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ ඔඩපනයක් විකුණනලද අවස්ථාවක, ඒ ඔඩපනයට අදාළ උකස් තුණ්ඩුවේ දෙවන හා තෙවන පිටපත්, එකී විකිණීම කළ දින සිට ගණන් ගනු ලබන මාස දොළහක කාලයක් ඉකුත් වන තෙක් බඩු උකස් ගන්නා විසින් තම සන්තකයේ තබා ගත යුතු ය.

25. (1) යම් ඔඩපනයක් යම් බඩු උකස් ගන්නකු වෙත උකස් කර තිබියදී නිශ්චිතව නියමිත යම් තත්ත්වයක් යටතේ ඒ ඔඩපනය නැතිවූ අවස්ථාවකදී, ඒ බඩු උකස් ගන්නා විසින් තබා ඇති ඇපය, බඩු උකස් කරන්නාට හෝ ඒ ඔඩපනය නිදහස් කර ගැනීමට හිමිකම් ඇති වෙනත් යම් තැනැත්තෙකුට හෝ වන්දි ගෙවීම සඳහා, නියමිත ආකාරයට යෙදවිය යුතු ය.

*බඩු උකස්ගන්නන් විසින් තබා ඇති ඇප මුදල් යෙදවීම හා ආපසු ගෙවීම*

(2) බඩු උකස් ගන්නකු විසින්, වන්දි ලැබීමට හිමිකම් ලබන අය වෙත, ඉහත (1) වන උප වගන්තිය යටතේ වන්දි මුදල් ගෙවීම හේතුවෙන් 9 වන වගන්තියේ (2) වන උප වගන්තිය අනුව බලපත්‍රලාභියා විසින් තැබිය යුතු ඇප මුදලින් අඩුවන ප්‍රමාණය ඇප වශයෙන් නැවත තැන්පත් කළ යුතු ය. ඉහත (1) වන උප වගන්තිය යටතේ ගෙවිය යුතු වන්දි මුදල තබා ඇති ඇප මුදල ඉක්මවා යන්නේ නම් එවිට, එසේ ඉක්මවන මුදල් ප්‍රමාණය ද ගෙවිය යුතු ය. ඊට අමතරව 9 වන වගන්තියේ (2) වන උප වගන්තියේ සඳහන් ඇප මුදල ද උකස් ගන්නා විසින් නැවත තැන්පත් කළ යුතු ය.

*ඇපය හිලව් කිරීම හා ව්‍යාපාරයේ ගණන් බේරා නිදහස් කිරීම*

(3) යම් තැනැත්තකු විසින් බඩු උකස්ගන්නකු වශයෙන් ව්‍යාපාරය කරගෙන යෑම අත්හරින ලද අවස්ථාවක දී, ඔහු විසින් තබා ඇති ඇප මුදලින් ඉහත (1) වන උප වගන්තියේ සඳහන් වන්දි මුදල ගෙවීම සඳහා යම් මුදලක් අවශ්‍යවේනම් එම මුදල අඩුකරගෙන ඉතුරු මුදල ඒ බඩු උකස්ගන්නාට ගෙවිය යුතු ය.

*ව්‍යාපාරය ඇවර කරන ලද අවස්ථාවක දී ඇප මුදල නැවත උකස් ගන්නාට ගෙවීම*

26. ගින්නෙන් හෝ ගින්නක් හේතුකොටගෙන හෝ වෙනත් ස්වභාවික ආපදාවක් හේතුකොටගෙන ඔඩපනයක් විනාශ වූ හෝ ඔඩපනයකට හානි වූ අවස්ථාවක, උකස නිදහස් කළහැකි කාල සීමාව ඇතුළත උකස්කරු විසින් කරනු ලබන ඉල්ලීමක් මත, උකස් කළ දිනට ඔඩපනයේ වටිනාකමින් ණය මුදල සහ පොලියද, ඒ ණය වෙනුවෙන් ගෙවිය යුතු යම් බද්දක් වේ නම්, එම බද්ද ද අඩුකර, ඉතිරි මුදල උකස්කරන්නා වෙත ගෙවීමට බඩු උකස්ගන්නා බැඳී සිටී.

*ඔඩපනයට හානි වූ අවස්ථාවක*

27. සෑම බඩු උකස්ගන්නකුම තමා වෙත උකස් කරනු ලැබ ඇති ඔඩපනවල සම්පූර්ණ වටිනාකම හා වර්ෂයක් තුළ උකස් වශයෙන් ලබාගැනීමට අදහස් කරන සියළුම භාණ්ඩවල සම්පූර්ණ වටිනාකම අනුව තම ව්‍යාපාරය විවෘතව තබන මුළු කාල සීමාවට අදාළව පූර්ණ වගකීමක් සහිත වූ රක්ෂණයකින් ආවරණය වන පරිදි රක්ෂණය කළ යුතු ය.

*රක්ෂණ ආවරණයක් ලබාගත යුතුය.*

28. ඔඩපනයක් නිදහස් කරන වේලාවේදී, බඩු උකස්ගන්නකු වෙත ආපසු ගෙවන ලද ණය මුදල සහ පොළී මුදල ද, ඒ ණය මුදල වෙනුවෙන් ගෙවිය යුතු යම් බද්දක් වේ නම් එම බදු මුදල ද ඇතුළත් කර පළමු උප ලේඛනයේ ''ඉ'' ආකෘතිය අනුව සැකසූ ලදුපතක් සෑම බඩු උකස් ගන්නකු විසින්ම නිකුත් කළ යුතු අතර, එම ලදුපතේ පිටපතක් බඩු උකස් ගන්නා විසින් ද තබාගත යුතු ය.

*ඔඩපනය නිදහස් කරන විට නිකුත් කරන ලදුපත*

29. (1) ඔඩපනය නිදහස් කළ හැකි කාල සීමාව ඇතුළත නිදහස් කර ගනු නොලබන සෑම ඔඩපනයක්ම ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමෙන් බැහැර කරනු ලැබිය හැකි නමුත්, වෙනත් ආකාරයකින් බැහැර කරනු නොලැබිය යුතු ය. තව ද තුන්වන උපලේඛනයේ සඳහන් නියෝග ඒ විකිණීමේදී පිළිපැදිය යුතු ය.

*ඔඩපන වෙන්දේසියේ විකිණිය හැකි බව*

වෙන්දේසි පැවැත්වීම සඳහා ආදායම් කොමසාරිස්ගේ අනුමැතිය ලබාගත යුතු බව

(2) මෙම වගන්තියේ පෙරාතුවම වූ විධිවිධාන යටතේ ඔඩපනයක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට යන විට, එම ඔඩපනය උකස් කර ඇත්තේ යම් බඩු උකස්ගන්නකු වෙත ද, ඒ බඩු උකස්ගන්නා විසින් එම වෙන්දේසිය පැවැත්වීමට නියමිත දිනය හා වේලාව ද, එම වෙන්දේසිය පැවැත්වීමට නියමිත ස්ථානය ද පිළිබඳ මූලික දැන්වීමක්, යටත් පිරිසෙන් දින හැටකට කලින් අවසර ලබාගැනීම පිණිස ආදායම් කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. එම දැන්වීම ලැබීමෙන් පසුව, ආදායම් කොමසාරිස්වරයා විසින් තම තීරණය වෙන්දේසිය පැවැත්වීමට නියමකර ඇති දිනයට අවම වශයෙන් දින තිහකට පෙර උකස්ගන්නා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

(3) මෙම ප්‍රඥප්තිය යටතේ ඔඩපනයක් වෙන්දේසි කිරීමට තීරණය කර ඇති අවස්ථාවකදී, එම ඔඩපනය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා ආදායම් කොමසාරිස්වරයාගෙන් අවසර ලබාගත් පසු එකී දිනය, වේලාව සහ වෙන්දේසිය සිදු කරනු ලබන ස්ථානය පිළිබඳ ලිඛිත දැන්වීමක් වෙන්දේසි දිනට යටත් පිරිසෙයින් දින දාහතරකට ප්‍රථම බඩු උකස්ගන්නා විසින් ලියාපදිංචි තැපෑලෙන් ඔඩපනය උකස්කළ තැනැත්තා වෙත යැවිය යුතු ය.

ණය පොළිය සහ බද්දක් ඉක්මවන මුදලකට ඔඩපනය විකිණීමකදී කාර්ය පරිපාටිය

30. මෙම ප්‍රඥප්තිය යටතේ ඔඩපනයක් විකුණනු ලැබූ සෑම අවස්ථාවකදීම, එම ඔඩපනය මත දෙන ලද ණය මුදල හා එම ඔඩපනය විකුණූ දිනය දක්වා එම ණය මුදල වෙනුවෙන් අයවිය යුතු පොළිය ද, ඒ ණය වෙනුවෙන් ගෙවිය යුතු යම් බද්දක් වේ නම් එම බදු මුදල ද ඉක්මවන මුදලකට එම ඔඩපනය විකුණනු ලැබූ විට, බඩු උකස් ගන්නා විසින් -

(අ) ඔඩපනය විකුණනු ලැබූ මුදල කොපමණ ද යන්නත්, එම මුදලින් අයවිය යුතු ණය මුදල, පොළිය, යම් බද්දක් හා විකිණීම සඳහා අවශ්‍යයෙන් දරන වියදම් සහ ගාස්තු අඩු කිරීමෙන් පසු බඩු උකස්කරන්නාගේ බැරට ඇති මුදල කොපමණ ද යන්නත්, වෙන්දේසිය අවසන් වී සති දෙකක් තුළ ඔඩපන පොතේ සඳහන් ලිපිනයට උකස්කරන්නා වෙත ලිඛිත දැන්වීමක් ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

(ආ) ඔඩපනය විකුණනු ලැබූ දිනයේ සිට එක් අවුරුදු කාල සීමාවක් ඇතුළත එකී බැරට ඇති මුදල උකස් කළ තැනැත්තා විසින් ඉල්ලා සිටියහොත්, උකස් ගන්නා එම මුදල උකස් කළ තැනැත්තාට ගෙවිය යුතු ය.

(ඇ) සෑම වර්ෂයකම ජූනි මස තිස්වන දින හා දෙසැම්බර් තිස් එක් වන දින උකස් කරන්නන් විසින් හිමිකම් පානු නොලබන මුදල් වේ නම්, එකී මුදල් පිළිබඳ වාර්තාවක් ආදායම් කොමසාරිස්වරයා වෙත උකස් ගන්නා විසින් ඉදිරිපත් කළ යුතු ය.

(ඈ) ඉහත (ආ) වන ඡේදයේ විධිවිධාන පරිදි අවුරුද්දක කාලසීමාව ඇතුළත, උකස්කරු විසින් එකී බැරට ඇති මුදල ඉල්ලා හිමිකම්පානු නොලැබුවහොත්, එම කාල සීමාව ඉකුත් වූ වහාම එම මුදල ආදායම් කොමසාරිස්වරයා වෙත භාර කළ යුතු ය.

ආදායම් කොමසාරිස් වෙත තැන්පත් කර ඇති ඔඩපන විකුණුම් මුදල් සම්බන්ධව කාර්යය පරිපාටිය

31. (1) 30 වන වගන්තියේ විධිවිධාන අනුව යම් මුදලක්, ආදායම් කොමසාරිස්වරයා වෙත තැන්පත් කරන ලද අවස්ථාවකදී ආදායම් කොමසාරිස්වරයා විසින් ඒ බව උකස් කරන්නා වෙත නොපමාව දන්වා යැවිය යුතු ය.

(2) ආදායම් කොමසාරිස්වරයා විසින් ඉහත (1) වන උප වගන්තිය යටතේ යවන ලද දැන්වීමක් තමා වෙත ලැබුන දිනයේ සිට මාස හයක් ඇතුළත එකී දැන්වීමෙහි සඳහන් මුදල තමා වෙත ගෙවන ලෙස උකස්කරන්නා විසින් ආදායම් කොමසාරිස්වරයාගෙන් ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කරන ලද්දේ නම්, එම මුදල එකී ඉල්ලීම ලැබී දින තිහක් ඇතුළත උකස්කරන්නා වෙත ආදායම් කොමසාරිස්වරයා විසින් ගෙවනු ලැබිය යුතු ය.

(3) ඉහත (2) වන උප වගන්තිය යටතේ මාස හයක කාලයක් ඇතුළත ඉල්ලීමක් ඉදිරිපත් කරනු නොලැබුවහොත්, උකස්කරන්නා වෙත ගෙවිය යුතුව තිබූ මුදල ආදායම් කොමසාරිස්වරයා විසින් පළාත් සභා අරමුදලට බැර කළ යුතු ය.

බඩු උකස් ගන්නාට වෙන්දේසියේදී ඔඩපන මිලට ගත නොහැකි බව

32. යම් බඩු උකස්ගන්නකු වෙත උකස් කර තිබුණු ඔඩපනයක් මෙම ප්‍රඥප්තිය යටතේ පවත්වනු ලබන හෝ පවත්වනු ලබන්නේ යැයි සැලකෙන ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකුණන විට එකී උකස් ගන්නාට එම ඔඩපනය සඳහා ලංසු තැබිය නොහැක.

## VII වන පරිච්ඡේදය

### ආවේක්ෂණය, පරීක්ෂණය සහ තහනමට අල්ලා ගැනීම

ඔඩපන විකුණුම් පොත් හා ගිණුම් ආවේක්ෂණය කිරීමේ බලය

33. (1) ඔඩපනයක් මෙම ප්‍රඥප්තිය යටතේ විකුණන ලද දින සිට අවුරුදු දෙකක් ඇතුළත, කවර විටෙක වුව ද බඩු උකස්ගන්නාගේ පොතෙහි එම විකිණීම පිළිබඳව කර ඇති සටහන සහ වෙන්දේසිකරු විසින් තම අත්සන යොදා සහතික කරන ලද එම වෙන්දේසිය පිළිබඳ තොරතුරු ඇතුළත් කළ නාමාවලියෙහි කර ඇති සටහන් හෝ එම දෙකින් කවර වුවද සටහනක් උකස් තුණ්ඩුව දරන්නා විසින් ආවේක්ෂණය කළ හැකි අතර, එම විකිණීම සම්බන්ධයෙන් එම පොතෙහි හා නාමාවලියෙහි හෝ එම දෙකින් එකක හෝ ඇතුළත් සටහන් ආවේක්ෂණය කිරීමට බඩු උකස්ගන්නා විසින් එම උකස් තුණ්ඩුව දරන්නාට අවසර දිය යුතු ය.

(2) ආදායම් කොමසාරිස්වරයා හෝ ඔහු විසින් ලිඛිතව බලය පවරන ලද රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නිලධාරියෙකුට හෝ කණ්ඩායමකට බඩු උකස් ගන්නකුගේ ව්‍යාපාරයට අයත් ගිණුම් පරීක්ෂා කිරීමට බලය ඇත්තේ ය.

උකස් කරන්නා විසින් තමා පිළිබඳව සහ උකස්කරනු ලබන භාණ්ඩ පිළිබඳ නිවැරදි තොරතුරු ඉදිරිපත් නොකරන විට ගතයුතු ක්‍රියා මාර්ග

34. යම් බඩු උකස් කරන්නකු සම්බන්ධයෙන් -

(අ) උකස් තැබීම සඳහා යම් භාණ්ඩයක් බඩු උකස් ගන්නෙකු වෙත ඉදිරිපත් කිරීමේදී තම ජාතික හැඳුනුම්පත, වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ රියදුරු බලපත්‍රය ඉදිරිපත් නොකිරීම සහ/හෝ

(ආ) උකස් තැබීම සඳහා යම් භාණ්ඩයක් බඩු උකස් ගන්නෙකු වෙත ඉදිරිපත් කරයි ද, එහෙත් තමාට එම භාණ්ඩය ලැබුනේ කෙසේ ද යන්න පිළිබඳව සතුටුදායක විස්තරයක් කිරීම ප්‍රතික්ෂේප කිරීම සහ/හෝ එවැනි විස්තරයක් කිරීමට අපොහොසත් වීම ; සහ/හෝ

(ඇ) උකස් තැබීම සඳහා බඩු උකස් ගන්නකු වෙත ඉදිරිපත් කරන භාණ්ඩයක් තමාගේ ම දේපළක් ද නැද්ද යන්න පිළිබඳව හෝ ඔහුගේ නම හා ලිපිනය පිළිබඳව හෝ ඕනෑකමින්ම අසත්‍ය තොරතුරු සැපයීම ; සහ/හෝ

(ඈ) නිදහස් කර ගැනීමට හිමිකමක් නොමැති ඔඩපනයක් නිදහස් කර ගැනීමට උත්සහ කිරීම හෝ වෑයම් කිරීම ; සහ/හෝ

(ඉ) යම් භාණ්ඩයක් උකස් තැබීම සඳහා බඩු උකස් ගන්නකු වෙත ඉදිරිපත් කළවිට එම භාණ්ඩය සොරකම් කරන ලද හෝ වෙනත් ආකාරයකින් නීති විරෝධී ලෙස ලබාගන්නා ලද භාණ්ඩ බව සැක කිරීමට හේතු ඒ බඩු උකස් ගන්නාට තිබීම,

යන ඉහත කී කරුණු සැළකිල්ලට ගැනීමේදී යුක්තිසහගත හෝ සාධාරණ සැකයක් බඩු උකස් ගන්නා වෙත පවතින අවස්ථාවක බඩු උකස් ගන්නා විසින්, ඒ පිළිබඳව ප්‍රදේශය අයත් පොලිස් ස්ථානය වෙත වහා දැන්විය යුතු ය.

බඩු උකස්ගන්නකුගේ සාප්පුව හෝ වාසස්ථානය සෝදිසි කිරීමේ බලය

35. ආදායම් කොමසාරිස්වරයා විසින් හෝ ඔහු විසින් ලිඛිතව බලය දෙනු ලැබූ රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ යම් නිලධාරියෙකු හෝ කණ්ඩායමක් විසින් යම් බඩු උකස්ගන්නකුගේ ව්‍යාපාර ස්ථානයකට යම් වේලාවක ඇතුළු වී, එම බඩු උකස් ගන්නා වෙත උකස්කර තිබෙන යම් ඔඩපනයක් සහ/හෝ ඔහු පවත්වා ගෙන යන පොත්, ලියවිලි පරීක්ෂා කර අවශ්‍ය සටහන් ලියා ගැනීම නීත්‍යානුකූල වන්නේ ය. ඒ සඳහා පොලිස් නිලධාරියෙකුගේ සහාය අවශ්‍ය බව අදායම් කොමසාරිස්වරයා තීරණය කරනු ලබන්නේ නම් පොලිස් නිලධාරියෙකු සමග ගොස් ඉහත ක්‍රියා සියල්ලම හෝ ඉන් කිසිවක් හෝ ඉටුකළ හැක්කේ ය. ඉහත කාර්යය ඉටු කිරීමේදී කිසිදු තැනැත්තකු විසින් ඉහත සඳහන් නිලධාරියෙකුට හෝ කණ්ඩායමට ප්‍රතිරෝධය නොදැක්විය යුතු ය.

## VIII වන පරිච්ඡේදය

### වැරදි සහ දණ්ඩන

බඩු උකස්කරන්නන් හා වෙනත් තැනැත්තන් කරන වැරදි

36. (1) (අ) උකස් කිරීම සඳහා යම් භාණ්ඩයක් බඩු උකස් ගන්නකු වෙත ඉදිරිපත් කරන, එහෙත් තමාට එහි සන්තකය ලැබුනේ කෙසේද යන්න පිළිබඳව සතුටුදායක විස්තරයක් කිරීම ප්‍රතික්ෂේප කරන හෝ ඊට අපොහොසත් ; සහ/හෝ

(ආ) උකස් කිරීම සඳහා බඩු උකස්ගන්නකු වෙත ඉදිරිපත් කරන යම් භාණ්ඩයක් තමාගේම දේපළක් ද නැද්ද යන්න සම්බන්ධයෙන් සහ/හෝ තමාගේ නම හා ලිපිනය සම්බන්ධයෙන් සහ/හෝ ඒ භාණ්ඩයේ අයිතිකරුගේ නම හා ලිපිනය සම්බන්ධයෙන් හිතාමතාම අසත්‍ය තොරතුරු ඒ බඩු උකස්ගන්නා වෙත සපයන ; සහ/හෝ

(ඇ) වෙනත් තැනැත්තකුගේ දේපළක් වන යම් භාණ්ඩයක්, නීත්‍යානුකූලව නිදහසට කරුණක් නොමැතිව, බඩු උකස්ගන්නකු වෙත උකස් කරන ; සහ/හෝ උකස් කිරීමට තැත්කරන සහ/හෝ

(ඈ) නිදහස් කර ගැනීමට හිමිකමක් නොමැති ඔඩපනයන් නිදහස් කර ගැනීමට උත්සාහ කරන ; සහ/හෝ

(ඉ) යම් බඩු උකස්ගන්නකු විසින් භාණ්ඩයක් උකස්කිරීම සඳහා බඩු උකස් ගන්නකු වෙත ඉදිරිපත් කලවිට එම භාණ්ඩය සොරකම් කරන ලද හෝ වෙනත් ආකාරයකින් නීති විරෝධී ලෙස ලබා ගන්නා ලද හෝ භාණ්ඩයක් බව සැක කිරීමට හේතු ඒ බඩු උකස්ගන්නාට ඇතිවිට හා ඒ සම්බන්ධයෙන් අසත්‍ය තොරතුරු දුන දූනම ප්‍රකාශ කරන ; සහ/හෝ

සෑම තැනැත්තෙක්ම වරදකට වරදකරු වන්නේ ය.

අනුබල දීම

(2) මෙම ප්‍රඥප්තියේ යම් විධිවිධානයක් කඩ කරන හෝ ප්‍රඥප්තියෙන් කළයුතු යැයි නියම කරන ලද දෙයක් කිරීම පැහැර හරින ; සහ/හෝ එසේ කිරීම සඳහා අනුබල දෙන

සෑම තැනැත්තෙක්ම ද වරදකට වරදකරු වන්නේ ය.

බඩු උකස්ගන්නන් විසින් කරනු ලබන වැරදි

37. (1) මෙම ප්‍රඥප්තියේ 4 වන වගන්තියේ විධිවිධාන පරිදි ආදායම් කොමසාරිස්වරයාගෙන් විධිමත් බලපත්‍රයක් ලබානොගෙන බඩු උකස්ගන්නකුගේ ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන ; සහ/හෝ

(2) මෙම ප්‍රඥප්තියේ 8 වන වගන්තියේ විධිවිධාන පරිදි ආදායම් කොමසාරිස්වරයා වෙත වාර්ෂික ගිණුම් වාර්තාවක් ඉදිරිපත් නොකරන ; සහ/හෝ

(3) මෙම ප්‍රඥප්තියේ 22 වන වගන්තියේ සහ/හෝ 34 වන වගන්තියේ විධිවිධාන කඩකරන හෝ නැතහොත් පැහැර හරින ; සහ/හෝ

(4) මෙම ප්‍රඥප්තියේ 27 වගන්තිය මගින් නියම කර ඇති ආකාරයට තම ව්‍යාපාරය පූර්ණ වගකීමක් සහිත වූ රක්ෂණයකින් ආවරණය කර ගැනීම පැහැර හරින සහ/හෝ

(5) වයස අවුරුදු දහ අටට අඩු බව සහ/හෝ බීමත්ව සිටින බව පෙනෙන යම් තැනැත්තෙකුගෙන් යම් භාණ්ඩයක් උකස්ගන්නා ; සහ/හෝ

(6) උකස් තුණ්ඩුවේ මුල් පත්‍රිකාව උකස්කරන්නා වෙත භාරනොදී භාණ්ඩයක් උකස්ගන්නා ; සහ/හෝ

(7) වෙනත් බඩු උකස්ගන්නකු විසින් නිකුත් කරන ලද උකස් තුණ්ඩුවක මුල් පත්‍රිකාව මිලට ගන්නා හෝ උකස් ගන්නා හෝ හුවමාරු කරන ; සහ/හෝ

(8) භාණ්ඩයක් උකස් ගැනීම සඳහා වයස අවුරුදු දහ අටට අඩු සේවකයකු සේවයෙහි යොදවන ; සහ/හෝ

(9) තමා වෙත උකස් කර ඇති ඔඩපනයක් තමා විසින් මිළදී ගැනීමේ අදහසින් නිදහස් කර ගැනීමට ඉඩ සළස්වන ; සහ/හෝ

(10) තමා වෙත උකස් කරන ලද ඔඩපනයක් එය නිදහස් කර ගැනීමේ කාලය තුළදී හෝ උකස් කිරීම සඳහා ඉදිරිපත් කරන ලද යම් භාණ්ඩයක් එම අවස්ථාවේදී මිලට ගැනීමට, විකිණීමට හෝ බැහැර කිරීමට එම භාණ්ඩය උකස් කරන ලද නැතහොත් උකස් කිරීමට ඉදිරිපත් කරන ලද තැනැත්තා සමග එකඟත්වයට පැමිණෙන ; සහ/හෝ

(11) තමා වෙත උකස් කරන ලද ඔඩපනයක් එය නිදහස් කර ගැනීමේ කාලය තුළදී හෝ උකස් කිරීම සඳහා ඉදිරිපත් කරන ලද යම් භාණ්ඩයක් එම අවස්ථාවේදී මිළට ගැනීමට, විකිණීමට හෝ බැහැර කිරීමට උකස්කරු නොවන වෙනත් තැනැත්තෙකු සමග එකඟතාවයට පැමිණෙන ; සහ/හෝ

(12) තමා වෙත උකස් කොට ඇති යම් ඔඩපනයක්, මෙම ප්‍රඥප්තියේ බලය දී ඇති ආකාරයට හැර, විකුණන හෝ වෙනත් ආකාරයකින් බැහැර කරන ; සහ/හෝ

(13) පවත්වාගෙන යා යුතු යයි මෙම ප්‍රඥප්තියෙන් තමාට නියමිත යම් පොතක අසත්‍ය සටහනක් කරන හෝ එහි ඇතුළත් කළයුතු යැයි මෙම ප්‍රඥප්තියෙන් තමාට නියමිත යම් සටහනක් ඇතුළත් කිරීම පැහැර හරින ; සහ/හෝ

(14) මෙම ප්‍රඥප්තියේ ප්‍රකාශිත දඬුවමක් සඳහන් නොවන වෙනත් කුමන හෝ විධිවිධානයක් උල්ලංඝනය කරන,

සෑම බඩු උකස් ගන්නෙකුම වරදකට වරදකරු වන්නේ ය.

38. සේදීමට, ශුද්ධ කිරීමට, මැදීමට, අළුත්වැඩියා කිරීමට, නිෂ්පාදනය කිරීමට, වැඩ දැමීමට, නිමහම් කිරීමට හෝ අලංකාර කිරීමට යම් තැනැත්තෙකුට දෙන ලදැයි දන්නා රෙදිපිළි හෝ නිම නොකළ භාණ්ඩ හෝ ද්‍රව්‍ය කිසිවක් දැන දැනම උකස් ගනු ලබන සෑම බඩු උකස් ගන්නෙක්ම, වරදකට වරදකරුවෙක් වන්නේ ය. ඇතැම් අවස්ථාවලදී රෙදිපිළි, ඇඳුම්, හා නොනිමි භාණ්ඩ ආදිය උකස් ගැනීම තහනම් බව

39. යම් උකස්කරුවකුගේ බැරට ඇති මුදල 30 වන වගන්තියෙන් නියම කර ඇති ආකාරයට ආදායම් කොමසාරිස්වරයා වෙත තැන්පත් කිරීම පැහැරහරින, සෑම බඩු උකස්ගන්නකුම වරදකට වරදකරු වන්නේ ය. තැන්පත් කිරීම පැහැරහැරීම වරදක් බව

40. (1) පුද්ගල මණ්ඩලයක් විසින් වරදක් සිදුකරනු ලැබූ අවස්ථාවකදී එවිට එකී පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නම් ඒ සංස්ථාවේ සියළු අධ්‍යක්ෂවරයන් හා නිලධරයන් හෝ ව්‍යාපාර ආයතනයක් නම් ඒ ව්‍යාපාර ආයතනයේ සියළු හවුල්කරුවන් හෝ ව්‍යාපාර ආයතනයක් නොවන සංස්ථාගත නොකළ සමාගමක් නම් එහි කළමනාකරණය හා පාලනය සඳහා වගකිවයුතු ඒ සමාගමේ සියළු නිලධරයන් ඒ වරද සඳහා වරදකරු වශයෙන් සළකනු ලැබිය යුතු ය. සීමිත සමාගමක අධ්‍යක්ෂවරුන් හා කළමණාකරුවන් විසින් කරනු ලබන වැරදි

එසේ වුවද එම වරද ඔහුගේ අනුදැනුමකින් තොරව සිදුකරනු ලැබූ බව හෝ ඒ වරද සිදුකරනු ලැබීම වැළැක්වීමට පියවර ගනු ලැබූ බව ඔහු විසින් ඔප්පු කරනු ලබන්නේ නම් එවැනි කිසිදු තැනැත්තෙකු ඒ වරද සඳහා වරදකරුවෙකු ලෙස සළකනු නොලැබිය යුතු ය.

(2) බඩු උකස්ගන්නකුගේ ව්‍යාපාරය කර ගෙන යෑමේදී හෝ ඊට සම්බන්ධව හෝ එම බඩු උකස්ගන්නාගේ සේවකයා නැතහොත් ඔහුගේ නියෝජිතයා විසින් කරනු ලැබූ හෝ කිරීම පැහැර හරිනු ලැබූ හෝ යම් කාර්යයක් අවස්ථාවෝචිත පරිදි එම බඩු උකස්ගන්නා විසින් කරනු ලැබූ හෝ කිරීම පැහැර හරිනු ලැබූ හෝ කර්යයක් ලෙස සළකනු ලැබිය යුතු ය. බඩු උකස්ගන්නකුගේ සේවකයකු හෝ නියෝජිතයකු විසින් කරනු ලබන වැරදි

එසේ වුවද, බඩු උකස් ගන්නකුගේ යම් සේවකයකු හෝ නියෝජිතයකු හෝ විසින් මෙම ප්‍රඥප්තියේ යම් විධිවිධානයක් කඩවන පරිදි යම් කාර්යයක් කරන ලද්දේ නම් හෝ එසේ කිරීම පැහැර හරින ලද්දේ නම් හෝ එම සේවකයා හෝ නියෝජිතයා හෝ වරදකට වරදකරු වන්නේ ය.

41.(1) *(අ)* ''මෙම ප්‍රඥප්තියේ 2, 3(1), 4(1), 14, 17, 19, 22(4), 27, 29, 30, 34, 36, 37(12), 38, 39, 44, 45 වගන්ති උල්ලංඝනය කරමින් කටයුතු කරන සෑම තැනැත්තෙක්ම මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විටක, රුපියල් ලක්ෂ දෙකකට නොඅඩු දඩයකට හෝ මාස හයකට නොවැඩි කාලයක් බන්ධනාගාර ගතකරනු ලැබීමට හෝ එම දඩය සහ බන්ධනාගාර ගතකිරීමට යන දෙකටම හෝ යටත්විය යුත්තේ ය. ඉහත දණ්ඩන වලට අමතරව උකස් ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන උකස්කරුවෙකුගේ ව්‍යාපාරය වසා දැමීම සඳහා නියෝග කිරීමටද අධිකරණයට බලය ඇත්තේ ය. එකී උකස් ව්‍යාපාරය සහ ඔඩපනවල ආරක්ෂාව, ඔඩපන නැවත අයිතිකරුවන් වෙත භාරදීම යනාදිය සම්බන්ධයෙන් අවස්ථානුගතව ඉදිරිපත් වන කරුණු මත අධිකරණය විසින් සුදුසු නියෝග කළ හැක්කේ ය.'' වැරදි සහ දණ්ඩන

*(ආ)* වාර්ෂික බලපත්‍රයක් ලබා නොගෙන උකස් ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන බඩු උකස්ගන්නකුට ඉහත (1) (අ) උප වගන්තිය යටතේ දක්වා ඇති දණ්ඩන වලට අමතරව අයවීමට ඇති හිඟ වාර්ෂික බලපත්‍ර ගාස්තු සහ මෙම ප්‍රඥප්තියේ 7 වන වගන්තියේ (5) වන උප වගන්තියේ විධිවිධාන පරිදි දඩ මුදලට සමාන මුදලක් දඩයක් ලෙස අය කර ගැනීමට අධිකරණය විසින් නියෝග කරනු ලැබිය යුතු ය. මෙම උප වගන්තිය යටතේ අධිකරණය විසින් අය කරනු ලබන සෑම මුදලක්ම පළාත් සභා අරමුදලට බැර කළ යුතු ය.

*(ඇ)* වාර්ෂික බලපත්‍රය අළුත් නොකර උකස් ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන උකස්ගන්නකුට ඉහත (1)(අ) උප වගන්තිය යටතේ දක්වා ඇති දණ්ඩනවලට අමතරව අයවීමට ඇති හිඟ වාර්ෂික බලපත්‍ර ගාස්තු සහ මෙම ප්‍රඥප්තියේ 7 වන වගන්තියේ (4) වන උප වගන්තියේ විධිවිධාන පරිදි අයවිය යුතු දඩ මුදලට සමාන මුදලක් දඩයක් ලෙස අය කර ගැනීමට අධිකරණය විසින් නියෝග කරනු ලැබිය යුතු ය. මෙම උප වගන්තිය යටතේ අධිකරණය විසින් අය කරනු ලබන සෑම මුදලක්ම පළාත් සභා අරමුදලට බැර කළ යුතු ය.

(ඇ) ඉහත (1) (අ) උප වගන්තිය යටතේ දණ්ඩනයකට අමතරව 38 වගන්තිය යටතේ වරදකට වරදකරු කරනු ලැබූ විට එම වරද සඳහා එම අධිකරණය විසින් පනවනු ලැබිය හැකි වෙනත් යම් දඬුවමකට අමතරව, එම ඔඩපනය අධිකරනය ඉදිරිපිටදී හෝ අධිකරණය විසින් විධානය කරනු ලබන වෙනත් ආකාරයකට හෝ එකී අයිතිකරුට භාරදෙන ලෙස එම බඩු උකස්ගන්නාට ඒ අධිකරණය විසින් නියෝග කරනු ලැබිය හැක්කේ ය.

(ඉ) ඉහත (1) (අ) වන උප වගන්තිය යටතේ දණ්ඩනයකට අමතරව 39 වගන්තිය යටතේ වරදට වරදකරු කරනු ලැබූ විට එම වරද සඳහා එම අධිකරණය විසින් පනවනු ලැබිය හැකි වෙනත් යම් දඬුවමකට අමතරව එකී මුදලට සමාන මුදලක්, දඩයක් අයකර ගන්නා ආකාරයෙන් ඒ බඩු උකස්ගන්නාගෙන් අයකර ගැනීමට එම අධිකරණය විසින් නියෝග කරනු ලැබිය යුතු ය. ඒ සෑම මුදලක්ම අධිකරණය විසින් අයකරගනු ලැබූ කල්හි, එම මුදල් ආදායම් කොමසාරිස් භාරයේ තැන්පත් කරනු ලැබිය යුතු ය.

පොදු දණ්ඩන

41. (2) මෙම ප්‍රඥප්තියේ 13, 15, 18(1), 18(3), 19, 24, 32, 35, 37(5), 37(6), 37(7), 37(8), 37(9), 37(11), 37(13) සහ 54 යන වගන්ති උල්ලංඝනය කරමින් කටයුතු කරන සෑම තැනැත්තෙක්ම මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ කරනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විටක රුපියල් ලක්ෂයකට නොඅඩු දඩයකට හෝ මාස 06කට නොවැඩි කාලයක් බන්ධනාගාර ගත කරනු ලැබීමට හෝ එම දඩය සහ බන්ධනාගාර ගත කිරීම යන දෙකටම හෝ යටත්විය යුත්තේ ය.

බඩු උකස්ගන්නකුගේ සන්තකයෙහි නීති විරෝධීව තබාගෙන ඇති බඩු

42. යම් බඩු උකස්ගන්නකුගේ සන්තකයෙහි යම් භාණ්ඩයක් හෝ භාණ්ඩ කිහිපයක් නීති විරෝධීව තබාගෙන ඇති බව මෙම ප්‍රඥප්තිය යටතේ පවත්වාගෙන යනු ලබන නඩු කටයුත්තකදී, යම් අධිකරණයකට වාර්තා කරනු ලබන කවර හෝ අවස්ථාවකදී, එම භාණ්ඩ හෝ භාණ්ඩය අධිකරණයට ඉදිරිපත් කරන ලෙස ද, සුදුසු යැයි ඒ අධිකරණය විසින් සලකනු ලබන නියමයන් නිසිවක් ඇතොත් එම නියමයන් යටතේ ඒ අධිකරණය විසින් නම් කරනු ලබන යම් තැනැත්තකුට එම භාණ්ඩය හෝ භාණ්ඩ භාර දෙන ලෙස ද, එසේ කළ නොහැකි අවස්ථාවකදී අදාළ භාණ්ඩය හෝ භාණ්ඩ රාජසන්තක කරන ලෙසද, නියෝග කිරීමේ බලය එම අධිකරණයට ඇත්තේ ය.

## IX වන පරිච්ඡේදය

*ව්‍යාපාරයේ අයිතිය පැවරීම හා ව්‍යාපාරය අවසන් කිරීම*

බලපත්‍රයක් ඉල්ලුම් කිරීමේදී උකස්ගන්නාගේ මරණින් පසුව ව්‍යාපාරය පැවරිය යුතු තැනැත්තා සම්බන්ධයෙන් සාධන පත්‍රයක් ඉදිරිපත් කළ යුතු බව

43. (1) බඩු උකස්ගන්නකුගේ ව්‍යාපාරය තනි පුද්ගලයකු විසින්, පවත්වාගෙන යනු ලබන්නේ නම් එකී පුද්ගලයාගේ මරණින් පසුව, යම් තැනැත්තෙකුට එකී ව්‍යාපාරයේ අයිතිය පැවරීමට අදහස් කරන්නේ නම් ද එම තැනැත්තා විසින් ඒ බව සඳහන් කරමින් නිසි පරිදි සකස් කරන ලද සාධන පත්‍රයක් බලපත්‍රය සඳහා ලියාපදිංචියට ඉල්ලුම් කරන අවස්ථාවේදී හෝ වාර්ෂික බලපත්‍රය ලබාගන්නා අවස්ථාවේදී හෝ එකී පුද්ගලයා ඉදිරිපත් කළ යුතු ය. එසේ වුව ද එලෙස නම් කරන ලද තැනැත්තා බඩු උකස්ගන්නන්ගේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම සඳහා මේ ප්‍රඥප්තිය යටතේ බලපත්‍රයක් ලබා දීමට සුදුසුකම් සපුරා ඇති අයෙකු විය යුතු ය.

(2) ඉහත (1) වන උප වගන්තිය යටතේ ව්‍යාපාරය පැවරීමට නම් කර ඇති තැනැත්තා මියගිය අවස්ථාවකදී, එම තැනැත්තා වෙනුවට වෙනත් තැනැත්තෙකු සමග අත්සන් කරනු ලබන බැඳීම් ඇතුළත් සාධන පත්‍රයක් ආදායම් කොමසාරිස්වරයා වෙත බඩු උකස්ගන්නා විසින් නැවත ඉදිරිපත් කළ යුතු ය.

(3) උකස් ව්‍යාපාරයක් හවුල්කරුවන් විසින් පවත්වාගෙන යනු ලබන විට එම ව්‍යාපාරය අවසන් කිරීමේදී උකස්කරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා හවුල් ව්‍යාපාර ගිවිසුමෙහි විධිවිධාන ඇතුළත් කර තිබිය යුතු ය. හවුල් ව්‍යාපාර ගිවිසුමෙහි ඒ පිළිබඳව විධිවිධාන ඇතුළත් කර නොමැති බව ආදායම් කොමසාරිස්වරයාගේ මතය වන්නේ නම්, බලපත්‍රය නිකුත් කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබිය යුතු ය.

ව්‍යාපාරය පැවරීම සඳහා ආදායම් කොමසාරිස්ගේ ලිඛිත අවසරයක් ලබාගත යුතු බව

44. (1) උකස් ව්‍යාපාරයක් කරගෙන යනු ලබන බඩු උකස්ගන්නකු, එම ව්‍යාපාරය යම් දිනයක සිට වෙනත් යම් තැනැත්තෙකු වෙත පැවරීමට අදහස් කරන්නේනම්, ආදායම් කොමසාරිස්වරයාගෙන් එම දිනයට තුන් මසකට පෙර ලිඛිතව ඉල්ලීමක් කළ යුතු ය.

(2) (අ) එවන් ඉල්ලීමක් ලැබුණු විට, ආදායම් කොමසාරිස්වරයා විසින්, එකී ඉල්ලීම ලැබී දින හතක් ඇතුළත :-

(i) එම ව්‍යාපාරයේ බඩු උකස් ගැනීම නිශ්චිතව සඳහන් දිනයක සිට නතර කරන ලෙස ;

(ii) බඩු උකස්ගන්නා විසින් තම ව්‍යාපාරය පිහිටි ප්‍රදේශය අයත් පොලිස් ස්ථානයේ පොලිස් ස්ථානාධිපතිගෙන් සහ ස්ථිර පදිංචි ප්‍රදේශය අයත් පොලිස් ස්ථානයේ පොලිස් ස්ථානාධිපතිගෙන් පොලිස් නිෂ්කාෂණ සහතිකයක් ඉදිරිපත් කරන ලෙස ;

(iii) පැවරුම්ලාභියා විසින් ද මෙම ප්‍රඥප්තියේ 3(2) උප වගන්තියේ සඳහන් කරුණු ඇතුළත් දිවුරුම් ප්‍රකාශයක් සහ තමන් ව්‍යාපාරයක් කරනු ලබන්නේ නම් එම ව්‍යාපාරය පිහිටි ප්‍රදේශය අයත් පොලිස් ස්ථානයේ පොලිස් ස්ථානාධිපතිගෙන් සහ ස්ථිර පදිංචි ප්‍රදේශය අයත් පොලිස් ස්ථානයේ පොලිස් ස්ථානාධිපතිගෙන් පොලිස් නිශ්කාෂණ සහතිකයක් ඉදිරිපත් කරන ලෙස ;

(iv) නිදහස් කිරීමට ඇති සියළු ඔඩපන හා උකස් කාල සීමාව තුළ බේරා නොගත් ඔඩපන පිළිබඳ සියළු තොරතුරු ඉදිරිපත් කරන ලෙස ;

(v) ආදායම් කොමසාරිස්වරයා අවශ්‍යයැයි සළකනු ලබන වෙනත් තොරතුරු ඉදිරිපත් කරන ලෙස,

බඩු උකස්ගන්නා වෙත ලිඛිතව දැනුම්දීම කළ යුතු ය.

(ආ) මෙම වගන්තිය යටතේ ආදායම් කොමසාරිස්වරයා වෙත ලිඛිත ඉල්ලීමක් කිරීමට බැඳී ඇති තැනැත්තා යම් ශාරීරික හා මානසික අශක්නුතාවයකට පත්ව ඇත්නම්, එම ව්‍යාපාරය තනි පුද්ගල ව්‍යාපාරයක් වන්නේ නම්, එකී ඉල්ලීම එම තැනැත්තාගේ නීත්‍යානුකූල උරුමකරුවෙකු විසින් කරනු ලැබිය යුතු ය. හවුල් ව්‍යාපාරයක් වන්නේනම් එකී ඉල්ලීම වෙනත් හවුල්කරුවෙකු/හවුල්කරුවන් විසින් කරනු ලැබිය යුතු ය.

(3) ඉහත (1) වන උප වගන්තිය යටතේ උකස් ව්‍යාපාරයක් පැවරීම සඳහා ඉල්ලීමක් ආදායම් කොමසාරිස්වරයා වෙත ලැබූ දින සිට ලිත් මසක් ඇතුළත තම තීරණය ආදායම් කොමසාරිස්වරයා විසින් එකී තැනැත්තා වෙත ලිඛිතව දැනුම්දිය යුතු ය.

(4) ඉහත (3) වන උප වගන්තිය යටතේ ආදායම් කොමසාරිස්වරයා විසින් තම තීරණය ලිඛිතව දැනුම්දුන් දින සිට දින තිහක් ඇතුළත බඩු උකස් ගන්නා විසින් තම ව්‍යාපාරය පවරනු ලබන තැනැත්තාගේ නම සහ ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය, පවරනු ලබන දිනය ආදී තොරතුරු සඳහන් ප්‍රසිද්ධ දැන්වීමක් ව්‍යාපාර ස්ථානයේ සහ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පුවත්පත්වල දැන්වීමක් මගින් ප්‍රසිද්ධ කළ යුතු ය.

45. (1) උකස් ව්‍යාපාරයක් කරගෙන යනු ලබන බඩු උකස් ගන්නකු තම ව්‍යාපාරය අවසන් කිරීමට අදහස් කරන්නේ නම්, එසේ ව්‍යාපාරය අවසන් කිරීමට අදහස් කරන දිනට තුන් මසකට පෙර ලිඛිත ඉල්ලීමක් ආදායම් කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. ව්‍යාපාරය අවසන් කිරීම

(2) ඉහත (1) වන උප වගන්තිය යටතේ උකස් ව්‍යාපාරයක් කරගෙන යනු ලබන යම් තැනැත්තෙකු, ආදායම් කොමසාරිස්වරයා වෙත ලිඛිත ඉල්ලීමක් කළ විට එම තැනැත්තා විසින් තම ව්‍යාපාරය අවසන් කිරීමට අදහස් කරන බවට දැන්වීමක් එකී ඉල්ලීම කළ දින සිට දින දාහතරක් ඇතුළත ව්‍යාපාර ස්ථානයේ සහ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පුවත්පත්වල දැන්වීමක් මගින් ප්‍රසිද්ධ කළ යුතු ය.

(3) (අ) ඉහත (1) වන උප වගන්තිය යටතේ ව්‍යාපාරය අවසන් කිරීම සඳහා වන ලිඛිත ඉල්ලීමක් ලැබුණු විට, ආදායම් කොමසාරිස්වරයා විසින්, එම ලිපිය ලැබී දින හතක් ඇතුළත -

(i) එම ව්‍යාපාරයේ බඩු උකස් ගැනීම නිශ්චිතව සඳහන් දිනයක සිට නතර කරන ලෙස ;

(ii) නිදහස් කිරීමට ඇති සියළු ඔඩපන පිළිබඳ සියළු තොරතුරු ඉදිරිපත් කරන ලෙස ;

(iii) අවසන් ඔඩපනය නිදහස් කළයුතු දිනය තෙක් ව්‍යාපාර කටයුතු කරනු ලබන බවට දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කරන ලෙස,

බඩු උකස්ගන්නා වෙත ලිඛිතව දැනුම්දීම කළ යුතු ය.

(ආ) තවද ආදායම් කොමසාරිස්වරයා විසින් එකී බඩු උකස්ගන්නා එම ව්‍යාපාරය වසා දැමීමට ඉල්ලා ඇති බව අදාළ පොලිස් ස්ථානයට දන්වා ඔහුගේ ව්‍යාපාරයට එරෙහිව අපරාධ වරදක් සම්බන්ධයෙන් පැමිණිලි කිසිවක් තිබේද යන්න පිළිබඳව සහ එකී ව්‍යාපාරයට එරෙහිව අපරාධ වරදක් සම්බන්දව අධිකරණයේ නඩු කටයුත්තක් තිබේද යන්න පිළිබඳවද වන වාර්තාවක් බඩු උකස්ගන්නාගේ ස්ථිර පදිංචිය අයත් සහ ව්‍යාපාරය අයත් පොලිස් ස්ථානවල පොලිස් ස්ථානාධිපතිවරුන්ගෙන් කැඳවිය යුතු ය.

(ඇ) ඉහත (1) වන උපවගන්තිය යටතේ ආදායම් කොමසාරිස්වරයා වෙත ඉල්ලීමක් කිරීමට බැඳී ඇති තැනැත්තා, යම් ශාරීරික හා මානසික අශක්නුතාවයකට පත්ව ඇත්නම්, එම ව්‍යාපාරය තනි පුද්ගල ව්‍යාපාරයක් වන්නේ නම් එකී ඉල්ලීම එම තැනැත්තාගේ නීත්‍යානුකූල උරුමකරුවෙකු විසින් කරනු ලැබිය යුතු ය. හවුල් ව්‍යාපාරයක් වන්නේනම් එකී ඉල්ලීම වෙනත් හවුල්කරුවෙකු/හවුල්කරුවන් විසින්, කරනු ලැබිය යුතු ය.

(4) ඉහත (1) වන උප වගන්තිය යටතේ උකස් ව්‍යාපාරයක් අවසන් කිරීම සඳහා ඉල්ලීමක් ආදායම් කොමසාරිස්වරයා වෙත ලැබූ දින සිට ලිත් මසක් ඇතුළත තම තීරණය එකී තැනැත්තා වෙත ලිඛිතව දැනුම්දිය යුතු ය.

(5) ඉහත (4) වන උප වගන්තිය යටතේ ආදායම් කොමසාරිස්වරයා විසින් තම තීරණය ලිඛිතව දැනුම්දුන් දින සිට දින තිහක් ඇතුළත බඩු උකස්ගන්නා විසින්, තම ව්‍යාපාරය අවසන් කරනු ලබන දිනය සඳහන් කරමින් ප්‍රසිද්ධ දැන්වීමක් ව්‍යාපාර ස්ථානයේ සහ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පුවත්පත්වල දැන්වීමක් මගින් ප්‍රසිද්ධ කළ යුතු ය.

## *X* වන පරිච්ඡේදය

### *විශේෂ අවස්ථා*

අශක්නුතාවයට පත් තැනැත්තා වෙනුවෙන් භාරකරු කටයුතු කළ යුතු බව

46. යම් තැනැත්තෙකු විසින් කරනු ලැබිය යුතු යැයි මේ ප්‍රඥප්තියෙන් නැතහොත් මේ ප්‍රඥප්තිය යටතේ නියමිත යම් ක්‍රියාවක් හෝ දෙයක් ඉටුකිරීම, ඒ තැනැත්තා ශාරීරික හා මානසික අශක්නුතාවයකට පත් තැනැත්තකු නම්, ඒ අශක්නුතාවයට පත් තැනැත්තාගේ නීත්‍යානුකූල බලයලත් තැනැත්තා විසින් කරනු ලැබිය යුතු ය.

හවුල් ව්‍යාපාරයක් වෙනුවෙන් ප්‍රමුඛ හවුල්කරු ක්‍රියාකළ යුතු බව

47. යම් තැනැත්තෙකු විසින් කරනු ලැබිය යුතු යැයි නැතහොත් මේ ප්‍රඥප්තිය යටතේ නියමිත යම් ක්‍රියාවක් හෝ දෙයක් ඉටු කිරීම තැනැත්තන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සිටින හවුල් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වන විට ඒ හවුල් ව්‍යාපාරයේ ප්‍රමුඛ හවුල්කරු විසින් කරනු ලැබිය යුතු ය.

තවද හවුල් ව්‍යාපාරයක ප්‍රමුඛ හවුල්කරු වශයෙන් මේ ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ දැනුම්දීමක් කරනු ලැබ ඇති යම් තැනැත්තෙකු ඔහු ඒ හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවෙකු නොවන බවට හෝ ශ්‍රී ලංකාවේ වෙනත් යම් තැනැත්තෙකු ඒ හවුල් ව්‍යාපාරයේ ප්‍රමුඛ හවුල්කරු වන බව සනාථ කරන්නේ නම් මිස, ඔහු ඒ හවුල් ව්‍යාපාරයේ ප්‍රමුඛ හවුල්කරු ලෙස සළකනු ලැබිය යුතු ය.

සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් වෙනුවෙන් වගකීම පැවරීම

48. පුද්ගල මණ්ඩලයක් විසින් මෙම ප්‍රඥප්තියෙන් නැතහොත් මෙම ප්‍රඥප්තිය යටතේ යම් ක්‍රියාවක් සිදුකරනු ලබන අවස්ථාවකදී එකී පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නම් ඒ සංස්ථාවේ සියළු අධ්‍යක්ෂවරයන් හා නිලධරයන් හෝ ව්‍යාපාර ආයතනයක්නම් ඒ ව්‍යාපාර ආයතනයේ සියළු හවුල්කරුවන් හෝ ව්‍යාපාර ආයතනයක් නොවන සංස්ථාගත නොකළ සමාගමක් නම් එහි කළමනාකරණය සහ පාලනය සඳහා වගකිවයුතු ඒ සමාගමේ සියළු නිලධරයන්ද ඒ ක්‍රියාව සම්බන්ධව වගකිවයුතු ය.

එසේ වුවද යම් සංස්ථාවක්, ව්‍යාපාර ආයතනයක් හෝ සංස්ථාගත නොකළ සමාගමක් වන පුද්ගල මණ්ඩලයක් වෙනුවෙන් මේ ප්‍රඥප්තියේ ඇති විධිවිධාන යටතේ දැනුම්දීමක් දෙනු ලැබූ යම් තැනැත්තෙකු විසින් එකී පුද්ගල මණ්ඩලය සමග තමන්ගේ කිසිදු සම්බන්ධතාවක් නැති බව හෝ අදාළ ක්‍රියාවක් සම්බන්ධව තමන් හට කිසිදු වගකීමක් නොමැති බව ඔප්පු කරන්නේ නම් ඒ තැනැත්තා ඒ ක්‍රියාවට වගකිවයුතු ලෙස සළකනු නොලැබිය යුතු ය.

පැවරුම්ලාභියා හිඟ මුදල් ගෙවිය යුතු බව

49. මෙම ප්‍රඥප්තිය යටතේ බඩු උකස් ගන්නකුගේ ව්‍යාපාරයක් පවත්වාගෙන යන යම් තැනැත්තෙකු විසින් ඒ ව්‍යාපාරය වෙනත් යම් තැනැත්තෙකු වෙත පවරනු ලැබූ අවස්ථාවක ඒ පැවරුමට පෙරාතුව වූ කාල සීමාව සඳහා ඒ ව්‍යාපාරය සම්බන්ධයෙන් අයවිය යුතු හිඟ මුදලක් සම්බන්ධයෙන් පැවරුම්ලාභී වෙත දැන්වීමක් කරනු ලැබ නොතිබුනද, එම පැවරුම් ලාභියාගෙන් එම හිඟ මුදල අයකරවා ගත යුතු ය.

මියගිය තැනැත්තෙකු විසින් ගෙවිය යුතු හිඟ මුදල් ගෙවීමට පොල්මංකරු යටත් බව

50. උකස් ව්‍යාපාරයක් කරගෙන ගිය යම් තැනැත්තෙකු මියගිය අවස්ථාවක, එම තැනැත්තා ජීවත්ව සිටියේ නම්, ඔහු මේ ප්‍රඥප්තිය යටතේ කිරීමට යටත්වන සියළු ක්‍රියා, කරුණු හා දේවල්, කිරීමට ඒ මියගිය තැනැත්තාගේ පොල්මංකරු යටත්විය යුතු අතර, මියගිය තැනැත්තා මියගිය දිනයට පෙර වූ සියළු කාල සීමාවන් සම්බන්ධයෙන්, ඔහු ජීවත්ව සිටියේ නම් ඔහුගෙන් අයකරගනු ලැබිය හැකිව තිබූ සියළු හිඟ මුදල්, ඒ පොල්මංකරු ගෙන් අයකරගනු ලැබිය යුතු ය ;

එසේ වුවද :

(අ) මියගිය තැනැත්තාගේ යම් ක්‍රියාවක් හෝ පැහැරහැරීමක් සම්බන්ධයෙන් මේ ප්‍රඥප්තියේ VIII වන පරිච්ඡේදයේ විධිවිධාන යටතේ පොල්ම පොල්මඃකරුට විරුද්ධව කිසිදු නඩු කටයුත්තක් පවරනු නොලැබිය යුතු ය ;

(ආ) මේ වගන්තිය යටතේ පොල්මඃකරුගේ වගකීම -

(i) මියගිය තැනැත්තාට මේ වගන්තිය යටතේ හිඟ මුදල් ගෙවීමට බැඳීමක් ඇති බවට දැන්වීමක් කරන ලද දිනයේදී පොල්මඃකරුගේ සන්තකය හෝ පාලනය යටතේ තිබුණු මියගිය තැනැත්තාගේ බූදලයේ ප්‍රමාණයට ; සහ

(ii) උරුමක්කාරයකුට හෝ ඒ බූදලය පිළිබඳ යම් සම්බන්ධතාවක් ඇති වෙනත් තැනැත්තෙකුට අයත් වී තිබිය හැකි ඒ බූදලයේ යම් කොටසක,

එකතුවට සීමා විය යුතු ය.

## *XI වන පරිච්ඡේදය*

### *හිඟ මුදල් අයකර ගැනීම*

51. (1) මෙම ප්‍රඥප්තිය යටතේ අයවිය යුතු යම් හිඟ මුදලක් අයකර ගැනීම සඳහා දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයකට පෙර ගෙවියයුතු බවට බඩු උකස්ගන්නා වෙත හෝ එකී වගකීම දරන්නා වෙත ලියාපදිංචි තැපෑලෙන් ආදායම් කොමසාරිස්වරයා විසින් දැනුම්දිය යුතු අතර එසේ නොගෙවන ලද යම් මුදලක් හිඟ මුදලක් ලෙස සළකා අයකරගනු ලැබිය යුතු ය.

හිඟ මුදල ගෙවන ලෙස දැනුම්දීම

(2) ඉහත පළමුවන උප වගන්තිය යටතේ යම් මුදලක් ගෙවීම පැහැරහැර ඇති අවස්ථාවක මින්මතු විධිවිධාන සලසා ඇති කවර හෝ ආකාරයකින් ඒ මුදල අයකර ගැනීමට පෙර ආදායම් කොමසාරිස්වරයා විසින් -

හිඟ මුදල අයකර ගැනීමට පෙර ලියාපදිංචි තැපෑලෙන් දැනුම්දීම

(අ) හිඟ මුදල පිළිබඳ විස්තර සහ

(ආ) හිඟ මුදල අයකර ගැනීම සඳහා කටයුතු කරන බවට

සඳහන් කරමින් බඩු උකස් ගන්නා වෙත හෝ එකී වගකීම දරන්නා වෙත ලියවිල්ලක් හෝ දැන්වීමක් ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

(3) ඉහත (2) උප වගන්තිය යටතේ ආදායම් කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද දැන්වීමක් බඩු උකස් ගන්නා වෙත හෝ එකී වගකීම දරන්නා වෙත ලැබුණු විට ඒ පිළිබඳ යම් විරෝධතාවක් ඇත්නම් ලිපියේ සඳහන් දින සිට දින තිහක් ඇතුළත බඩු උකස් ගන්නා විසින් ආදායම් කොමසාරිස්වරයා වෙත ලිඛිතව ඉදිරිපත් කළ යුතු ය. එම විරෝධතාව සළකා බලා ඒ පිළිබඳ තම තීරණය ආදායම් කොමසාරිස්වරයා විසින් එම ලිපිය ලැබී සති දෙකක් ඇතුළත බඩු උකස්ගන්නා වෙත හෝ එකී වගකීම දරන්නා වෙත ලිඛිතව දැන්විය යුතු ය. එම තීරණය අවසානාත්මක හා තීරණාත්මක වන්නේ ය.

හිඟ මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් විරෝධතාවක් ඉදිරිපත් කළ හැකි බව

52. (1) මෙම ප්‍රඥප්තිය යටතේ අයවියයුතු හිඟ මුදලක් අයකර ගැනීම සඳහා ආදායම් කොමසාරිස්වරයා විසින් හෝ ඔහු විසින් ලිඛිතව බලය පැවරූ තැනැත්තෙකු නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් වෙත සහතිකයක් ඉදිරිපත් කළ යුත්තේ ය.

හිඟ මුදල අයකර ගැනීම සඳහා මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන නීති කෘත්‍යය

(2) ආදායම් කොමසාරිස්වරයා විසින් ඉහත (1) වන උප වගන්තියේ කාර්ය සඳහා ඉදිරිපත් කරන ලද සහතිකයක ඇති යම් ප්‍රකාශයක නිරවද්‍යතාව ගැන මේ වගන්තිය යටතේ වූ යම් නඩු කටයුත්තකදී මහේස්ත්‍රාත්වරයා විසින් ප්‍රශ්න කිරීම හෝ විභාග කරනු ලැබීම හෝ නොකළ යුතු අතර, එකී සහතිකයේ සඳහන් මුදල දඩයක් ලෙස අයකර ගැනීමට කටයුතු කළ යුත්තේ ය.

(3) යම් නඩු කටයුත්තක දී පැහැර හැර ඇති හිඟ මුදල යථා පරිදි ගණනය කරනු ලැබූ බවට හා එය නොගෙවා පැහැර හැරිය බවට ආදායම් කොමසාරිස්වරයාගේ සහතිකය, ප්‍රමාණවත් සාක්ෂියක් විය යුතු අතර, හිඟ මුදල අධික බවට හෝ සාවද්‍ය බවට හෝ එයට විරුද්ධව අභියාචනා කොට ඇති බවට කරනු ලබන කිසිම උත්තරවාදයක් පිළිනොගත යුතු ය.

## *XII වන පරිච්ඡේදය*

*පොදු විධිවිධාන*

නියෝග පැනවීම

53. (1) නීති රෙගුලාසි සහ/හෝ නියෝග සෑදීමට මේ ප්‍රඥප්තියෙන් බලය දී ඇති හෝ මේ ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ කාරණා සම්බන්ධයෙන් පහත සඳහන් සීමාවන්ට යටත්ව නීති රෙගුලාසි සහ/හෝ නියෝග අමාත්‍යවරයා විසින් කලින් කලට සෑදිය හැක්කේ ය.

(2) ඉහත (1) වන උප වගන්තිය මගින් පවරන ලද බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව -

*(අ)* නියම කළයුතු බවට මේ ප්‍රඥප්තියෙන් නියමිත යම් කරුණක් නියම කරමින් ; සහ

*(ආ)* බදු උකස් ගන්නන් විසින් ඇප තබනු ලැබීමට අනුශාංගික හෝ පරිපූරක වන යම් කරුණක් සඳහා විධිවිධාන සලස්වමින්,

අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම රීති, රෙගුලාසි සහ/හෝ නියෝග ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු අතර, එසේ පළකරනු ලැබූ දින සිට හෝ ඒ රීතියෙහි, රෙගුලාසියෙහි සහ/හෝ නියෝගයෙහි නිශ්චිතව සඳහන් යම් පසු දිනයක සිට හෝ එකී රීති, රෙගුලාසි සහ/හෝ නියෝග ක්‍රියාත්මක වන්නේ ය.

(4) මේ වගන්ති යටතේ සාදනු ලැබූ සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළකරනු ලබන දිනයේ සිට තුන් මසක කාල සීමාවක් ඇතුළත හෝ ඒ කාල සීමාව ඇතුළත පළාත් සභාවේ රැස්වීමක් පවත්වනු නොලැබුවහොත් ඒ කාල සීමාව ඉකුත් වූ පසු පවත්වනු ලබන ප්‍රථම පළාත් සභා රැස්වීමේදී ඒ තීරණය කිරීම හෝ නියමය අනුමත කරනු ලැබීමට යෝජනාවක් මගින් පළාත් සභාවට ඉදිරිපත් කරනු ලැබිය යුත්තේ ය. එසේ ඉදිරිපත් කොට අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් ඒ අනුමැතියේ දින සිට පරිච්චින්න කරනු ලැබූ ලෙස සැලකියයුතු නමුත් ඒ නියෝගය යටතේ ඊට කලින් කරනු ලැබූ යම් දෙයකට ඉන් අගතියක් සිදු නොවන්නේ ය.

(5) යම් නියෝගයක් එසේ පරිච්චින්න කරන ලදැයි සළකනු ලබන්නේ කවර දිනයක සිට ද ඒ දිනය ගැසට් පත්‍රය මගින් නිවේදනය කරනු ලැබිය යුතු ය.

ආදායම් කොමසාරිස් විසින් තොරතුරු ඉල්ලා සිටීම

54. (1) මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා ආදායම් කොමසාරිස්වරයා විසින් යම් තැනැත්තෙකු වෙත ලිඛිත දැන්වීමක් මගින් නිශ්චිතව සඳහන් -

*(අ)* පොත්පත්, ගිණුම්, වෙළෙඳ ලැයිස්තු, තොග ලැයිස්තු, ලේඛන, වවුචර්, චෙක්පත්, උකස් තුණ්ඩු, ඔඩපන පොත්, විගණක වාර්තා හෝ ඒ තැනැත්තා සන්තකයෙහි ඇති ඒ දැන්වීමෙහි සඳහන් වෙනත් ලේඛන හෝ නිශ්චිතව සඳහන් කාල පරිච්ඡේද තුළදී ඉදිරිපත් කරන ලෙස;

*(ආ)* යම් තොරතුරක් සපයන ලෙස ;

*(ඇ)* යම් කරුණක් හෝ කරුණු පිළිබඳ පරීක්ෂා කරනු ලැබීම සඳහා යම් ස්ථානයකට එහි සඳහන් යම් දිනයක හා වේලාවක තමාම හෝ විධිමත් ලෙස තමා විසින් බලය පවරනු ලද නියෝජිතයෙකුට හෝ පැමිණෙන ලෙස,

නියම කරනු ලැබිය හැකි ය.

තොරතුරු රඳවා තබා ගැනීම

(2) ඉහත (1) වන උප වගන්තියේ (අ) ඡේදය පරිදි තොරතුරු සපයන ලෙස දැන්වීමක් මගින් නියම කරනු ලබන අවස්ථාවකදී, වෙනත් යම් ලිඛිත නීතියකට පටහැනිව කුමක් සඳහන් වුවද ඒ නොතකා ඒ තැනැත්තා විසින් ඉහත කී නියමයට අනුකූලව ක්‍රියා කළ යුතු අතර ආදායම් කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබූ හෝ ඉදිරිපත් කර තිබුණා වූ හෝ වෙනත් ආකාරයකින් තම සන්තකයට පත්වන හෝ පත්ව තිබෙන යම් පොත්, ගිණුම්, වෙළඳ ලැයිස්තු, තොග ලැයිස්තු, ලේඛන, වවුචර්, චෙක්පත්, උකස් තුණ්ඩු, ඔඩපන පොත්, විගණන වාර්තා හෝ වෙනත් ලියකියවිලි මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා තම භාරයෙහි යම් කාලයක් රඳවා ගැනීමට අවශ්‍ය වන්නේද ඒ කාලය සඳහා තම භාරයෙහි රඳවා ගනු ලැබිය හැකි ය.

55. මෙම ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි තැපැල් මගින් යවනු ලබන යම් දැන්වීමක්, එම දැන්වීම තැපෑලට භාරදුන් දින සිට දින හතක් අවසන් වූ දිනයේදී දැන්වීමේ නම සඳහන් තැනැත්තා වෙත භාරදුන් ලෙස සැළකිය යුතු ය.

දැන්වීම් භාරදීම

56. මෙම ප්‍රඥප්තිය යටතේ වූ යම් වරදක් සඳහා නඩු පැවරීම ආදායම් කොමසාරිස්වරයාගේ අනුමැතිය මත විය යුතු ය.

නඩු පැවරීම සීමා කිරීම

57. මෙම ප්‍රඥප්තිය යටතේ වූ කාර්යයන් ඉටුකිරීමේදී භාවිතා කළයුතු ආකෘතිපත්‍ර ආදායම් කොමසාරිස්වරයා විසින් කලින් කළ නියම කළ හැක්කේ ය. එසේ නියම කරනු ලැබූ යම් ආකෘති හෝ ලේඛන කලින් කළ සංශෝධනය කිරීම හෝ වෙනස් කිරීම හෝ එසේ නියම කරනු ලැබූ යම් ආකෘති පත්‍ර හෝ ලේඛන වෙනුවට වෙනත් යම් ආකෘති හෝ ලේඛන ආදේශ කිරීම ආදායම් කොමසාරිස්වරයා විසින් කළ හැකි ය.

ආකෘතිපත්‍ර සකස් කිරීම

58. මෙම ප්‍රඥප්තිය යටතේ ස්වකීය කාර්යය ඉටුකිරීමෙහිලා හැර, මේ ප්‍රඥප්තිය යටතේ පත්කරනු ලැබූ හෝ පත්කරනු ලදැයි සළකනු ලබන සෑම තැනැත්තකුම හෝ මේ ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා හෝ ක්‍රියාත්මක කිරීමෙහිලා යම් තැනැත්තකුට සහායවීම සඳහා හෝ සේවයෙහි නියුක්ත කරවනු ලැබ සිටින හෝ ලැබ සිටි සෑම තැනැත්තකුම, මේ ප්‍රඥප්තිය යටතේ ස්වකීය කාර්ය ඉටුකිරීමේ දී යම් තැනැත්තකුගේ කටයුතු පිළිබඳව තමාට දැන ගැනීමට ලැබෙන සියලු කාරණා සම්බන්ධයෙන් රහස්‍යභාවය ආරක්ෂා කිරීම හා ආරක්ෂා කිරීමෙහිලා සහායවීම කළ යුත්තේ ය. තවද, ඒ කාරණය අදාළ වන්නේ යම් තැනැත්තකුටද, ඒ තැනැත්තාට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයාට, අමාත්‍යවරයාට හෝ ප්‍රධාන ලේකම්ට හෝ ඔහුගේ බලයලත් යම් තැනැත්තකුට හැර, එවැනි යම් කාරණයක් නොදැන්විය යුතු අතර, ආදායම් කොමසාරිස්වරයාගේ සන්තකයෙහි, භාරයෙහි හෝ පාලනයෙහි ඇති ලේඛන කිසිවක් ලබා ගැනීමට යම් තැනැත්තකුට ඉඩ හැරීම හෝ අවසරදීම හෝ නොකළ යුතු ය.

නිල රහස්‍යතාවය

59. බඩු උකස්ගන්නකු විසින් කළ යුතු යැයි මෙම ප්‍රඥප්තියෙන් නියම කර ඇති හෝ කිරීමට මෙම ප්‍රඥප්තියෙන් බලය දී ඇති හෝ කවර කරුණක් වුව ද බඩු උකස්ගන්නාගේ අවසරය මත ඔහුගේ සේවකයා හෝ නියෝජිතයා විසින් කරනු ලැබිය හැකි ය.

උකස්කරු වෙනුවෙන් සේවකයා හෝ නියෝජිතයා විසින් කටයුතු කළ හැකි බව

60. මෙම ප්‍රඥප්තියේ සඳහන් බලතල, කර්තව්‍ය හෝ කාර්යය කිසිවක් ආදායම් කොමසාරිස්වරයාගේ අත්සන යටතේ ලිඛිතව බලය දෙනු ලැබූ රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නිලධරයකු විසින් ක්‍රියාත්මක කරනු හෝ ඉටු කරනු හෝ ලැබිය හැක්කේ ය.

මේ ප්‍රඥප්තිය යටතේ බලතල ආදිය පැවරීම

61. යම් භාණ්ඩයක් කිසියම් කොන්දේසි මත පසුව නිදහස් කරගන්නා බවට හෝ ආපසු මිළදී ගන්නා බවට හෝ ප්‍රකාශිත හෝ ව්‍යංගික එකඟ වීමක් හෝ පිළිගැනීමක් නැතහොත් ගනුදෙනුවෙහි ස්වරූපය හා ලක්ෂණ අනුව එවැනි එකඟ වීමක් හෝ පිළිගැනීමක් ඇතැයි යුක්තිසහගතව ව්‍යංගික වන එකඟවීමක් හෝ පිළිගැනීමක් යටතේ හෝ ඒ අනුව භාණ්ඩ මිළදී ගැනීම හෝ විකිණීම හෝ සඳහා දෙනු ලබන අත්තිකාරම් මුදල් වලට ඇප වශයෙන් භාණ්ඩ තබා ගැනීම සඳහා ව්‍යාපාර ස්ථානයක් පවත්වාගෙන යාම භාණ්ඩ මිළට ගෙන හෝ භාරගෙන හෝ තබාගෙන, ඒ වෙනුවෙන් යම් මුදල් ප්‍රමාණයක් ගෙවන්නාවූ හෝ අත්තිකාරම් වශයෙන් දෙන්නාවූ හෝ ණයට දෙන්නා වූ සෑම තැනැත්තෙකුම බඩු උකස් ගැනීමේ ව්‍යාපාරය කරන්නෙකු ලෙස මේ ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා සළකනු ලැබිය යුත්තේ ය. (තවද ඒ සෑම ගණුදෙනුව, භාණ්ඩය, ගෙවීම, අත්තිකාරම සහ ණය මේ ප්‍රඥප්තිය ඇතුළත පිළිවෙලින්, උකස, ඔඩපනය සහ ණය ලෙස සළකනු ලැබිය යුතු ය.)

ඇතැම් සාප්පුකරුවන් බඩු උකස්ගන්නන් වශයෙන් සළකනු ලැබිය යුතු බව

62. මෙම ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා 1979 අංක 15 දරන අපරාධ නඩු විධිවිධාන සංග්‍රහය පනතේ විධිවිධාන අදාළ වේ.

1979 අංක 15 දරන අපරාධ නඩු විධිවිධාන සංග්‍රහ පනත අදාළ විය යුතු බව

63. මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක දින සිට බස්නාහිර පළාතේ පළාත් සභාවේ 2001 අංක 03 දරන බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය පරිච්චින්න වන්නේ ය.

2001 අංක 03 දරන බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය පරිච්ජින්න වන බව

64. මෙම ප්‍රඥප්තියේ පටහැනිව කුමක් සඳහන්ව ඇත ද-

අන්තර් කාලීන විධිවිධාන

*(අ)* 1942 අංක 13 දරන බඩු උකස්ගන්නන්ගේ ආඥාපනත යටතේ හෝ බස්නාහිර පළාතේ පළාත් සභාවේ 2001 අංක 03 දරන බඩු උකස්ගන්නන්ගේ ප්‍රඥප්තිය යටතේ බස්නාහිර පළාත තුළ නිකුත්කර ඇති යම් බලපත්‍රයක් මෙම ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් ලෙස සැළකිය යුතු ය;

*(ආ)* 1942 අංක 13 දරන බඩු උකස්ගන්නන්ගේ ආඥාපනත යටතේ හෝ බස්නාහිර පළාතේ 2001 අංක 03 දරන බඩු උකස්ගන්නන්ගේ ප්‍රඥප්තිය යටතේ සාදනු ලැබූ නියෝග කිසිවක් ඉවත් කොට මේ ප්‍රඥප්තිය යටතේ සාදනු ලැබූ නියෝග ඒ වෙනුවට ආදේශ කරනු ලබනතෙක් එකී මේ ප්‍රඥප්තිය යටතේ සාදනු ලැබූ නියෝග ලෙස සළකනු ලැබිය යුතු ය ;

(ඇ) 1942 අංක 13 දරන බඩු උකස්ගන්නන්ගේ ආඥාපනත යටතේ හෝ බස්නාහිර පළාතේ 2001 අංක 03 දරන බඩු උකස්ගන්නන්ගේ ප්‍රඥප්තිය යටතේ පවරනු ලැබූ නියමිත දිනයට පෙරාතුවම වූ දිනය වන විට විභාගයට පාත්‍රව පැවතියා වූ යම් නඩුවක් සහ එවැනි නඩුවකදී අධිකරණයක් විසින් දෙනු ලැබූ යම් තීරණයක්, අවස්ථාවෝචිත පරිදි, මෙම ප්‍රඥප්තිය යටතේ පවරන ලද නඩුවක් ලෙස ද, මෙම ප්‍රඥප්තිය යටතේ පවරන ලද නඩුවකදී, දෙන ලද තීරණයක් ලෙස ද සලකනු ලැබිය යුතු ය.

## XIII වන පරිච්ඡේදය

### *අර්ථ නිරූපනය*

අර්ථ නිරූපනය

65. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වූවහොත් මිස මේ ප්‍රඥප්තියෙහි -

''නියමිත දිනය'' යන්නෙන් මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනය අදහස් වේ ;

''ආදායම් කොමසාරිස්වරයා'' යන්නෙන්, මේ ප්‍රඥප්තියේ කාර්යය සඳහා පත්කරන ලද බස්නාහිර පළාත් ආදායම් කොමසාරිස්වරයා අදහස් වේ ;

''විදේශීය සමාගම'' යන්නෙන්, ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථා ගතකරනු ලැබූ යම් සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් අදහස් වන අතර, එයින් -

(අ) නියමිත දිනට පසුව ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාරික ස්ථානයක් පිහිටුවනු ලැබ ; හෝ

(ආ) නියමිත දිනට පෙර ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාර ස්ථානයක් පිහිටුවා නියමිත දිනයේදී ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාරික ස්ථානයක් දිගටම පවත්වාගෙන යන,

යම් සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් අදහස් වේ ;

''බඩු උකස්ගන්නා'' යන්නෙන්, ලියාපදිංචි බැංකුවක් නොවන, බඩු උකස් ගැනීමේ ව්‍යාපාරය කරගෙන යන යම් තැනැත්තෙක් සහ යම් යම් කොන්දේසි මත පසුව නිදහස් කරන බවට හෝ ආපසු මිළදී ගන්නා බවට ප්‍රකාශිත හෝ ව්‍යංග සම්මුතියක් හෝ පිළිගැනීමක් නැතහොත් ගණුදෙනුවේ ස්වරූපය හා ලක්ෂණ අනුව එවැනි සම්මුතියක් හෝ පිළිගැනීමක් ඇතැයි යුක්ති සහගතව ව්‍යංග වන සම්මුතියක් ලෙස පිළිගැනීමක් යටතේ හෝ ඒ අනුව බඩු මිළට ගැනීම හෝ විකිණීම සඳහා දෙනු ලබන අත්තිකාරම් මුදල් වලට ඇප වශයෙන් භාණ්ඩ ලබා ගැනීම සඳහා ව්‍යාපාර ස්ථානයක් පවත්වාගෙන යමින් බඩු මිළයට ගෙන හෝ තබාගෙන ඒ වෙනුවෙන් යම් මුදල් ප්‍රමාණයක් ගෙවන්නා වූ හෝ අත්තිකාරම් වශයෙන් දෙන්නා වූ හෝ, ණයට දෙන්නා වූ යම් තැනැත්තෙකු අදහස් වේ ;

''උකස්කරන්නා'' යන්නෙන්, උකස් කිරීම සඳහා යම් භාණ්ඩයක් බඩු උකස්ගන්නා තැනැත්තෙකු වෙත භාරදෙන තැනැත්තෙක් අදහස් වේ ;

''ශ්‍රී ලංකාවේ පුරවැසියා'' යන්නෙන්, පුරවැසිභාවයට අදාළව තත්කාලයෙහි පවත්නා යම් නීතියක් යටතේ ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වන යම් පුද්ගලයෙකු අදහස් වේ ;

''දිස්ත්‍රික්කය'' යන්නෙන්, පරිපාලන දිස්ත්‍රික්කය අදහස් වේ ;

''විදේශ ව්‍යාපාර ආයතනය'' යන්නෙන් -

(අ) හවුල්කරුවන් දෙදෙනකුගෙන් සමන්විත වූ ව්‍යාපාරයක් වන විට ඉන් එක් හවුල්කරුවෙකු හෝ හවුල්කරුවන් දෙදෙනාම හෝ ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන්නා; හෝ

(ආ) හවුල්කරුවන් දෙදෙනකුට වැඩි ගණනකින් සමන්විත වූ ව්‍යාපාරයක් වන විට, ඔවුන් අතුරෙන් යටත් පිරිසෙයින් එක් හවුල්කරුවෙකු ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නා වූ ව්‍යාපාර ආයතනයක් අදහස් වේ;

''මාසය'' යන්නෙන්, ලාභ හෝ පොලී හෝ අය කිරීමේ කාර්යය සඳහා වූ විට, දින තිහක කාල පරිච්ඡේදයක් අදහස් වේ ;

''ලිත් වර්ෂය'' යන්නෙන්, සෑම වර්ෂයකම ජනවාරි මස පළමු වන දිනෙන් ආරම්භ වී දෙසැම්බර් මස තිස් එක්වන දිනෙන් අවසන් කාල පරිච්ඡේදය අදහස් වේ ;

''මුදල් වර්ෂය'' යන්නෙන්, සෑම වර්ෂයකම අප්‍රේල් මස පළමු වන දිනෙන් ආරම්භ වී එළඹෙන වර්ෂයේ මාර්තු තිස් එක්වන දිනෙන් අවසන් කාල පාරිච්ඡේදය අවසන් වේ ;

''තැනැත්තා'' යන්නට, යම් තනි පුද්ගලයෙකු හෝ පුද්ගල මණ්ඩලයක්, එකී පුද්ගල මණ්ඩලය සංස්ථාවක් වන්නේ නම් එම සංස්ථාවේ සියළු අධ්‍යක්ෂවරයන් හා නිලධරයන්ද ව්‍යාපාර ආයතනයක් නම් ඒ ව්‍යාපාර ආයතනයේ සියළු හවුල්කරුවන් හෝ ව්‍යාපාර ආයතනයක් නොවන සංස්ථාගත නොකළ සමාගමක් නම් එහි කළමනාකරණය සහ පාලනය සඳහා වගකිවයුතු ඒ සමාගමේ සියළු නිලධරයන් අදහස් වේ.

''ඔඩපනය'' යන්නෙන්, බඩු උකස්ගන්නෙකු වෙත උකස් තබන ලද භාණ්ඩය අදහස් වේ ;

''සාධන පත්‍රය'' යන්නෙන්, උකස් ව්‍යාපාරය පැවරීමකට අදාළව වෙනත් තැනැත්තන් සමග අත්සන් කරනු ලබන ලේඛනයක් අදහස් වේ.

''අමාත්‍යවරයා'' යන්නෙන්, බස්නාහිර පළාතේ පළාත් සභාවේ මුදල් විෂය භාර අමාත්‍යවරයා අදහස් වේ ;

''පළාත් සභාව'' යන්නෙන්, බස්නාහිර පළාත් සභාව අදහස් වේ ;

''ප්‍රධාන ලේකම්'' යන්නෙන් බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන ලේකම් අදහස් වේ ;

''පළාත් සභා අරමුදල'' යන්නෙන්, 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 19 වන වගන්තිය යටතේ පිහිටුවන ලද බස්නාහිර පළාතේ පළාත් සභා අරමුදල අදහස් වේ ;

''ව්‍යාපාර ස්ථානය'' යන්නෙන්, වාසස්ථානයක්, ගුදමක්, සාප්පුවක්, ව්‍යාපාර කටයුතු කරගෙන යනු ලබන කවර හෝ ස්ථානයක් සහ ඉහත සඳහන් කිසිවක ශාඛාවක් වශයෙන් පවත්වාගෙන යනු ලබන කවර හෝ ස්ථානයක් අදහස් වේ ;

''නොනිමි භාණ්ඩ හෝ ද්‍රව්‍ය'' යන්නට, භාණ්ඩ නැතහොත් ද්‍රව්‍ය කිසිවක් යම් නිෂ්පාදන තත්ත්වයට හෝ නිෂ්පාදන ක්‍රියාවලියට හෝ භාජනය කරනු ලැබීමෙන් පසු හෝ, භාණ්ඩ නැතහොත් ද්‍රව්‍ය කිසිවක් විෂයයෙහි හෝ ඒවා යොදු ගනිමින් හෝ යම් නිෂ්පාදන ක්‍රියාවලියකට හෝ ක්‍රියාවකට භාජනය කිරීමෙන් පසු ද ඇඳීම හෝ පරිභෝජනය හෝ උදෙසා නිම කිරීමට හෝ නිමහම් කිරීමට හෝ පෙර ද ඒ භාණ්ඩ හෝ ද්‍රව්‍ය කලවම් හෝ වෙන වෙනම හෝ යම් නිෂ්පාදන තත්ත්වයක පවතීද නැතහොත් යම් නිෂ්පාදනයක යම් කොටසක හෝ යම් අංශයක හෝ නිෂ්පාදනය වෙමින් පවතී ද එවැනි භාණ්ඩ කිසිවක් ද භාණ්ඩ සැකසීම නැතහොත් නිෂ්පාදනය කිරීම සඳහා පැහැදිලිවම අදහස් කර ඇති ද්‍රව්‍ය කිසිවක් ද ඇතුළත් වේ.

''හිඟ මුදල'' යන්නට, මෙම ප්‍රඥප්තිය යටතේ අයවිය යුතු හෝ ගෙවිය යුතු මුදලින් තත්කාලීනව ගෙවා නොමැති මුදල අදහස් වේ.

''පැහැරහැරී තැනැත්තා'' යන්නෙන්, මෙම ප්‍රඥප්තිය යටතේ ඉටු කිරීමට නියම කර ඇති කාරණයක් ඉටු නොකර සිටින සහ/හෝ නොකරන ලෙස නියම කරන ලද කාරණයක් කරනු ලබන යම් තැනැත්තෙකු අදහස් වේ.

''පොල්මඃකරු'' යන්නෙන්, මියගිය තැනැත්තකුගේ පොල්මඃකරු හෝ අදිමිනිස්ත්‍රාසිකරු අදහස් වන අතර -

(අ) මියගිය නැතැත්තකුගේ දේපළවල සන්තකය ලබාගන්නා හෝ ඒ සම්බන්ධයෙන් මැදිහත්වන යම් තැනැත්තෙක් ; හෝ

(ආ) මියගිය තැනැත්තෙකුගේ බූදලය සම්බන්ධයෙන් ප්‍රොබේට් බලපත්‍රය හෝ අදිමිනිස්ත්‍රාසි බලපත්‍රය ප්‍රදානය කිරීම හෝ නැවත මුද්‍රා තැබීම සඳහා දිසා අධිකරණයට ඉල්ලුම්කර ඇති හෝ ඉල්ලුම් කිරීමට හිමිකම් ඇති යම් තැනැත්තෙක් ; හෝ

(ඇ) භාරය පිහිටුවන තැනැත්තාගේ අන්තිම කැමති පත්‍රයෙන් පිහිටුවනු ලැබූ භාරයක් යටතේ ක්‍රියාකරන භාරකරුවෙක් ; හෝ

(ඈ) මෙම ප්‍රඥප්තියේ 43(1) වගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන බැඳීම් ඇතුළත් සාධන පත්‍රයේ නම සඳහන් තැනැත්තෙක් ;

ඊට ඇතුළත් වේ ;

''බලයලත් නියෝජිතයෙකු'' යන්නෙන්,

මේ ප්‍රඥප්තියේ කාර්යය සඳහා යම් තැනැත්තකු වෙනුවෙන් ක්‍රියා කිරීම සඳහා ඒ තැනැත්තා විසින් ලියවිල්ලකින් බලය දෙනු ලැබූවා වූ සහ -

(අ) පුද්ගලයෙක් සම්බන්ධයෙන් වන විට ඒ පුද්ගලයාගේ ඥාතියෙක් වන්නාවූ ද ;

(ආ) හවුල් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වන විට, ඒ හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවකු වන්නාවූ ද ;

(ඇ) සමාගමක් සම්බන්ධයෙන් වන විට ඒ සමාගමේ අධ්‍යක්ෂවරයකු හෝ ලේකම්වරයා වන්නාවූ ද ;

(ඈ) පුද්ගල මණ්ඩලයක් සම්බන්ධයෙන් වන විට ඒ පුද්ගල මණ්ඩලයේ සාමාජිකයකු වන්නාවූ ද
(ඉ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජිකයකු වන්නාවූ ද ;
(ඊ) නීතිඥවරයෙක් වන්නාවූ ද ;

පුද්ගලයන් අතරින් තැනැත්තෙක් අදහස් වේ ;

''ශාරීරික හා මානසික අශක්නුතාවයකට පත් තැනැත්තා'' යන්නෙන්, බාල වයස්කරුවෙක්, උන්මත්තෙකයෙක්, මුග්ධයෙක් හෝ සිහි විකල් තැනැත්තෙක් අදහස් වේ ;

''ලියාපදිංචි බැංකුවක්'' යන්නෙන්, 1988 අංක 30 දරන බැංකු පනතේ අර්ථානුකූලව බලපත්‍රලාභී බැංකුවක් අදහස් වේ ;

''ප්‍රමුඛ හවුල්කරු'' යන්නෙන්, ශ්‍රී ලංකාවේ පදිංචිව සිටින සක්‍රීය හවුල්කරුවන් අතුරින් -

(අ) හවුල් ව්‍යාපාර ගිවිසුමේ පළමුවෙන් නම් කොට ඇති ;

(ආ) එවැනි ගිවිසුමක් නොමැති නම්, හවුල් ව්‍යාපාර හෝ සාමාන්‍ය නාමයෙන් තනිවම හෝ අනික් හවුල්කරුවන්ට ප්‍රමුඛව නමින් හෝ මුලකුරුවලින් සඳහන් කොට ඇති ; හෝ

(ඇ) 1987 අංක 7 දරන ව්‍යාපාර නාම පනතේ 4 වන වගන්තිය යටතේ කරනු ලැබූ ප්‍රකාශයෙහි පළමුවෙන් නම් කොට ඇති ;

හවුල්කරු අදහස් වේ ;

''භාරකරු'' යන්නට, යම් භාරකරුවෙක්, ආරක්ෂකයෙක්, දේපළ ආරක්ෂකයෙක්, කළමනාකරුවෙක් හෝ යම් තැනැත්තෙකු වෙනුවෙන් යම් දේපළක සංවිධානය, පාලනය හෝ කළමනාකරණය සතු ඇති වෙනත් තැනැත්තෙක් ඇතුළත් වේ ;

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

66. මේ ප්‍රඥප්තියේ සිංහල, දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

(4 වන වගන්තිය)

## පළමුවන උපලේඛනය

''අ'' ආකෘතිය

***බලපත්‍රය***

අංකය : ..............................

බස්නාහිර පළාතේ පළාත් සභාවේ 2015 අංක .......................................................... දරන බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තියේ 4 වන වගන්තිය ප්‍රකාරව බස්නාහිර පළාත් සභාවේ ආදායම් කොමසාරිස් ....................................................................... මම, එම ප්‍රඥප්තියෙන් වන මා වෙත පවරා ඇති බලතල ප්‍රකාරව ......................................................... යන ස්ථානයෙහි ......................................................... නමින් බඩු උකස් ගන්නෙකුගේ ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා ....................................... පදිංචි ............................................. මයා/මිය/සමාගම වෙත බස්නාහිර පළාත් සභාවේ 2015 අංක .................. දරන බඩු උකස්ගන්නන්ගේ ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ, මෙයින් බලය දී බලපත්‍ර දෙමි.

මේ බලපත්‍රයේ කාලය .............. 12.31 වන දින අවසන් වන්නේ ය.

| | |
|---|---|
| .......................... | ..................................... |
| දිනය | ආදායම් කොමසාරිස්/වෙනුවට. |

(17 වන වගන්තිය)

''ආ'' ආකෘතිය

**ඔඩපන පොත**

.................. හි බඩු උකස්ගන්නා වන ...................... ඔඩපන පොත

| උකස් අංකය හා එය නිකුත් කළ දිනය | මාසයේ ඔඩපන අංකය | එක් එක් භාණ්ඩය සඳහා දුන් ණය මුදල | එක් එක් භාණ්ඩය සඳහා එකඟවූ පොලී ප්‍රතිශතය | උකස් කරන්නාගේ නම | උකස් කරන්නාගේ ලිපිනය | උකස් කළ එක් එක් භාණ්ඩයේ විස්තර | උකස් කළ භාණ්ඩය ස්වර්ණාභරණයක් නම් එහි බර හා කැරට් ප්‍රමාණය | උකස් කළ එක් එක් භාණ්ඩයේ වටිනාකම | නිදහස් කර ගැනීමේ දිනය | නිදහස් කර ගන්නා තැනැත්තාගේ නම සහ ලිපිනය |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. ශ. | | | | | | රු. ශ. | | |

(17 වන වගන්තිය)

''ඇ'' ආකෘතිය

**ඔඩපන විකුණුම් පොත**

විකිණීම කළ දිනය හා ස්ථානය : ...........................................

වෙන්දේසිකරුගේ නම සහ ලිපිනය : ....................................

| ඔඩපන පොතේ දක්වෙන අන්දමට ඔඩපනයේ අංකය | උකස් කළ දිනය | උකස් කළ තැනැත්තාගේ නම | ණය මුදලේ ප්‍රමාණය | අයවිය යුතු පොලී ප්‍රමාණය | වෙන්දේසිකරු විසින් එක් එක් ඔඩපනය විකුණන ලද මුදල | මිළට ගත් තැනැත්තාගේ නම හා ලිපිනය |
|---|---|---|---|---|---|---|
| | | | රු. ශ. | රු. ශ. | රු. ශ. | |

(18 වන වගන්තිය)

"ඇ" ආකෘතිය

***උකස් තුණ්ඩුව***

බලපත්‍ර අංකය :- ............................

අංකය :- .................................

දිනය :- ...................................

මෙහි පහත අත්සන් කරන .................................................................... (බඩු උකස් තබන්නා) ........................................... හි පදිංචි ජාතික හැඳුනුම්පත් අංක/ගමන් බලපත්‍ර අංක ............................................... හිමි ......................................... (බඩු උකස් තබන්නාගේ නම) විසින් ....................................... (බඩු උකස්ගන්නාගේ ලිපිනය) හි පිහිටි .............................. (බඩු උකස්ගන්නාගේ නම) වෙනුවට ............................................ (බඩු උකස්ගන්නා හෝ ඔහුගේ නියෝජිතයාගේ නම) වෙත, වර්තමාන වෙළඳ වටිනාකමට රු............................ ක් වූ බර .................................................................... හා ................................... වර්ගයේ (භාණ්ඩයේ ස්වභාවය) ....................................... ක් උකස් කර රු. ....................................... ක මුදලක් ..................................... (මුදල අකුරින්) .............................. % ක වාර්ෂික පොළී අනුප්‍රමාණයක් යටතේ අද දින ලබාගත් බව සහතික වෙමි/වෙමු.

.......................................................................
බඩු උකස්ගන්නාගේ හෝ ඔහුගේ සේවකයාගේ
නැතහොත් නියෝජිතයාගේ අත්සන

..................................................
බඩු උකස්කරන්නාගේ අත්සන හෝ

..................................................
ජාතික හැඳුනුම්පත් අංකය

(උකස්කරන්නා ඔඩපනය නිදහස් කර ගන්නා අවස්ථාවේ මෙය අත්සන් කළ යුතු වේ.)
ඉහත සඳහන් භාණ්ඩය ම විසින් ඊට අදාළ මුළු මුදල සහ පොළිය ගෙවීමෙන් පසු නැවත මා සන්තකයට ලබා ගන්නා ලදී.

........................................
දිනය

..................................................
බඩු උකස් කරන්නාගේ අත්සන

(28 වන වගන්තිය)

"ඉ" ආකෘතිය

*ලදුපත*

*බලපත්‍ර අංකය :-* .................

අංක ....................................දරන ඔඩපනය වෙනුවෙන් ලබාදුන් ණය මුදල වන රු. ............................... ක මුදල සහ එකී මුදලට 20....../......../............ සිට 20 .... / ...... / දක්වා පොළිය වන රු. ............................... ක මුදල ද බදු මුදල් වශයෙන් රු. ............................ ක් ද ලෙස එකතුව රු. ......................................... ක් වූ මුදලක් ලදමි.

අත්සන ............................................................
නම ..................................................................
ආයතනයේ නම ..............................................
ලිපිනය .............................................................

දිනය :- .................................... (මුද්‍රාව)

15(2), (18 (2) සහ 19 වන වගන්තිය)

## දෙවන උපලේඛනය

**පොළී අනු ප්‍රමාණය**

ණයට දෙනු ලබන සෑම රුපියලක් හෝ රුපියලකින් කොටසක් සඳහා පොළී අනු ප්‍රමාණය සෑම මාසයක් හෝ මාසයකින් කොටසක් සඳහා ශත දෙකකට වැඩි නොවිය යුතු ය.

**බදු ගෙවීම**

ඔඩපනයක් මත දෙනු ලබන ණයක් වෙනුවෙන් බඩු උකස්කරන්නකු විසින් ලිඛිත නීතියක් යටතේ වූ යම් බද්දක් ගෙවිය යුතු අවස්ථාවක, එම බද්ද, උකස්ගන්නා විසින් ඔහුගෙන් අයකර ගත හැකිය.

**වැඩිපුර පොළී අයකිරීම සීමා කිරීම**

ඔඩපනයක් මත දෙනු ලබන ණයක් වෙනුවෙන් බඩු උකස්ගන්නෙකු උකස් තබන දිනයේ එකඟ වන පොළී අනුපාතය එදින සිට මාස විසිහතරක කාලයක් සඳහා පැවැත්වේ. එකී මාස විසිහතරක කාලය තුළ යම් පොළී වැඩිවීමක් සිදු වුවද එම පොළී වැඩි වීම එම ගනුදෙනුව සඳහා අදාළ කරගත නොහැක.

ඒ උකස් තුණ්ඩුවට අදාළ ඔඩපනය, එය උකස් කළ දින සිට මාස විසිහතරක කාලයක් තුළ දී බේරා ගනු නොලැබුවහොත් ඒ ඔඩපනය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබිය හැකි ය.

එසේ විකිණීමේදී ලැබුණු යම් අතිරික්ත ලාභයක් වේ නම්, එය එකී ලාභ මුදල උකස්ගන්නා විසින් උකස්කරන්නා වෙත ගෙවිය යුතු වෙයි.

(29 වන වගන්තිය)

## තුන් වන උපලේඛනය

### ඔඩපන වෙන්දේසි කිරීමට අදාළ නියෝග

1. වෙන්දේසි කරනු ලබන සියළුම ඔඩපන මහජනයා විසින් දැක බලාගනු පිණිස වෙන්දේසිකරු විසින් එකී වෙන්දේසිය ආරම්භ කිරීමට අවම වශයෙන් පැය දෙකකට පෙර සිට විවෘත කර තැබිය යුතුය.

2. ඔඩපන සම්බන්ධයෙන් පහත දැක්වෙන කරුණු ප්‍රකාශ කෙරෙන නාමාවලියක් වෙන්දේසිකරු විසින් ප්‍රසිද්ධ කළ යුතු ය.

(අ) බඩු උකස්ගන්නාගේ නම සහ ව්‍යාපාරික ස්ථානය ;

(ආ) ඒ ඔඩපනය උකස්කළ මාසය ;

(ඇ) එක් එක් ඔඩපනය උකස් කරනු ලැබූ අවස්ථාවේදී ඔඩපන පොතෙහි ඇතුළත් කරන ලද ආකාරයට ඒ එක් එක් ඔඩපනයේ අංකය.

3. අදාළ වෙන්දේසිය උකස්ගන්නාගේ ව්‍යාපාරික පරිශ්‍රයේදී සිදුකළ යුතු ය.

4. විකිණීම පිළිබඳ දැන්වීම වෙන්දේසිකරු විසින් යටත් පිරිසෙයින් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි පුවත්පත් තුනක අවම වශයෙන් එක් වරක්වත් ප්‍රසිද්ධ කළ යුතු අතර ඊට අමතරව විකිණීම කරනු ලබන ප්‍රදේශයේ මහජනයා ගැවසෙන ස්ථානවල දැන්වීම් මගින් ප්‍රදර්ශනය කළ යුතු ය. තවද ඒ දැන්වීම් වල පහත දැක්වෙන කරුණු ඇතුළත් විය යුතු ය.

(අ) බඩු උකස්ගන්නාගේ නම සහ ව්‍යාපාරික ස්ථානය ;

(ආ) අදාළ වෙන්දේසිය පවත්වනු දිනය, වේලාව හා ස්ථානය ;

(ඇ) කිනම් කාල වකවානුවක් තුළ උකස් කර බේරා නොගත් ඔඩපන එම වෙන්දේසියට ඇතුළත් වේද යන්න.

5. ඉහත අංක 04 නියෝගයෙහි සඳහන් දැන්වීම් අදාළ වෙන්දේසිය පැවැත්වීමට නියමිත වූ දිනට දින හතකට පෙරාතුවම වූ ඉරිදා දිනයක සහ/හෝ එදින සිට ප්‍රදර්ශනය කළ යුතු ය.

6. විකිණීමක් කරන ලද දින සිට දින දාහතරක් ඇතුළතදී එම වෙන්දේසියේදී විකුණූ ඔඩපන නාමාවලිය පිටපතක් හෝ ඒ බඩු උකස්ගන්නාගේ උකස් බඩුවලට අදාළ ඒ නාමාවලියේ කොටස හෝ, ඒ බඩු උකස්ගන්නාගේ උකස් බඩු සංඛ්‍යාව සහ විකුණන ලද මුදල කවරේදැයි සඳහන් කර වෙන්දේසිකරුගේ අත්සනින් එය සහතික කොට, ඒ බඩු උකස්ගන්නාට වෙන්දේසිකරු විසින් භාරදිය යුතු ය.

7. බඩු උකස්ගන්නා විසින්, ඒ වෙන්දේසියෙන් පසු යටත් පිරිසෙයින් අවුරුදු දෙකක කාලයක් එවැනි සෑම නාමාවලියක්ම සුරක්ෂිතව තබාගත යුතු ය.

07 - 900

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.